# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Performance Report

# 2011

අධ්‍යාපන අමාත්‍යාංශය  கல்வி அமைச்சு  Ministry of Education



# වාර්ෂික කාර්යසාධන වාර්තාව- 2011
## අධ්‍යාපන අමාත්‍යාංශය

මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4 ඡේදයෙහි විධිවිධාන වලට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළියෙල කර ඉදිරිපත් කරනු ලැබේ.

2012 ඔක්තෝබර්

අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල

# අධ්‍යාපන අමාත්‍යාංශය
# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2011

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4 වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුව මෙම අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කොට ඉදිරිපත් කරනු ලබන අතර, රජයේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රියාවලිය හා සම්බන්ධ සාරාංශගත පැතිකඩක් ඉන් නිරූපනය කර ඇති බව ද සතුටින් සඳහන් කරමි.

සාමාන්‍ය අධ්‍යාපනයෙන් පසු උසස් අධ්‍යාපනයට හා වෘත්තීය අධ්‍යාපනයට පිවිසෙන දරුවන්ට මෙන්ම සමාජයට පිවිසෙන දරුවන්ට ද ඔවුන්ගේ අනාගත ගමන් මඟෙහි සාර්ථකත්වයට සෘජුවම අදාල වනුයේ සාමාන්‍ය අධ්‍යාපනය තුළින් ලබා ගන්නා දැනුම හා කුසලතාවයයි.

එවැනි භාරදූර කාර්යයක වගකීම උසුලන අධ්‍යාපන අමාත්‍යාංශය 2011 වර්ෂය තුළ සාමාන්‍ය අධ්‍යාපනය සංවර්ධනය සඳහා ඉටුකරන ලද කාර්යභාරය ඉතා පුළුල් පරාසයක වේ.

ද්විතීයික පාසල් දහසක් හා ප්‍රාථමික පාසල් 5000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන කේන්ද්‍ර කොටගත් භෞතික සම්පත් සංවර්ධන සහ මානව සම්පත් සංවර්ධන වැඩසටහන් රැසක් සැලසුම් සකස් කිරීම මෙහිලා ප්‍රධාන වේ ගුණාත්මක සංවර්ධනයෙහිලා ශිෂ්‍ය සාධන මට්ටම් ඉහළ නැංවීම සඳහා විවිධ පියවර රැසක් මේ වසර තුළ ක්‍රියාවට නංවන ලදී.

එම වැඩසටහන් වල ප්‍රගතිය ඇතුළත් මෙම 2011 වර්ෂික කාර්යසාධන වාර්තාවෙහි සැකෙවින් ඇතුළත් වේ.

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ, තනතුරු හා නිලධාරීන් (2011.12.31 දිනට)

**අධ්‍යාපන අමාත්‍ය**

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා

**නියෝජ්‍ය අමාත්‍ය**

ගරු විජිත් විජිතමුණි ද සොයිසා මැතිතුමා

**අධීක්ෂණ මන්ත්‍රී**

ගරු මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමා

**අධ්‍යාපන ලේකම්**

එච්.එම්. ගුණසේකර මැතිතුමා

## පාලන හා මුදල් අංශය

අතිරේක ලේකම් - එන්.එච්.එම්. චිත්‍රානන්ද මයා

ප්‍රධාන ගණකාධිකාරී - බී.ඒ.කේ. ජයසිංහ මයා

**ආයතන හා පරිපාලන (ඒකාබද්ධ සේවා නොවන, විනය සහ විමර්ශන)**

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්** - පී.එච්.ඒ. විමලවීර මයා

**ආයතන හා පරිපාලන (ඒකාබද්ධ සේවය) සහ ඉඩම් ශාඛාව**

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්** - ආර්.බී. ගන්කේවල මිය

**පාර්ලිමේන්තු කටයුතු සහ ප්‍රවාහන ශාඛාව** - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ඒ.පී. ගුරුගේ මිය

**මුදල් ශාඛාව** - ගණකාධිකාරී - එස්.පී.එන්. සමරසිංහ මිය

**විවිධ ගිණුම් ශාඛාව** - ගණකාධිකාරී - ජේ.කේ.එස්.එන් පෙරේරා මයා

**ගෙවීම් ශාඛාව** - ගණකාධිකාරී - ගීතා හේමන්ති රූබසිංහ මිය

**විශ්‍රාම වැටුප් ශාඛාව** - ගණකාධිකාරී - වයි.එම්.එස්. ගුණසේකර මයා

**සැපයීම් ශාඛාව** - ගණකාධිකාරී - ඕ.පී.ආර්. දමයන්ති මිය

## අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය

අතිරේක ලේකම් - එච්.යු. ප්‍රේමතිලක මයා

**සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව** - අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩබ්.පී.එන්.ටී. ගුණතිලක මයා

**කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව** - අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.එල්.ඩී. බාලසූරිය මෙනවිය

**ද්වි භාෂා අධ්‍යාපන ශාඛාව** - අධ්‍යාපන අධ්‍යක්ෂ - ප්‍රියතා නානායක්කාර මිය

**විෂය සමගාමී මාර්ගෝපදේශ හා උපදේශන සහ සාම අධ්‍යාපන ශාඛාව**

අධ්‍යාපන අධ්‍යක්ෂ - ඒ.ඩී.එම්.ඩී. බණ්ඩාර මයා

**වාණිජ අධ්‍යාපන ශාඛාව** - අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්. කමනි පෙරේරා මිය

**අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය** - ලේකම් - විජිත වෙලගෙදර මයා

**ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව** - අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.එම්. වීරසූරිය මිය

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - ජී.එම්. නීල් ගුණදාස මයා

**ගණිත ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - විජේදාස හේවාවිතාරණ මයා

**කළමනාකරණ හා ප්‍රමිති ඒකකය -** අධ්‍යාපන අධ්‍යක්ෂ - එස්.එම්.එල්.කේ. සෙනවිරත්න මිය

**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපන ඒකකය -** අධ්‍යාපන අධ්‍යක්ෂ - **එස්.එල්.එම්.ඩී.පියසේන මයා**

**නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - **එච්.පී.එන්.ලක්ෂ්මන් මයා**

**ජාතික පාසල් ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - ජී.එන්. සිල්වා මයා

**වතු පාසල් සංවර්ධන ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්. සභාරංජන් මිය

**ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - පී.එම්.ඒ.එස්. පණ්ඩිතසේකර මිය

**ආගමික හා සාරධර්ම ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - එස්.බී.එම්. නිමල් ධර්මසිරි මයා

**විද්‍යා ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්.පී. විපුලසේන මයා

**පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - රේණුකා පීරිස් මෙනවිය

**පාසල් කටයුතු ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩබ්.කේ.ඩබ්. විජේතුංග මයා

**ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්.ඩී.ආර්. කරුණාරත්න මයා

**දෙමළ පාසල් ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - එස්. මුරලිදරන් මයා

**මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - ඉසෙඩ්. තාජුඩීන් මයා

**නව ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය -** ව්‍යාපෘති අධ්‍යක්ෂ - එල්.ආර්.වී. ගුණරත්න මයා

**තාක්ෂණ අධ්‍යාපන ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - ඒ.ඩී.නන්දසේන මයා

## අධ්‍යාපන සේවා ආයතන අංශය

අතිරේක ලේකම් - කේ. මොහොමඩ් තම්බි මයා

**අධ්‍යාපන සේවා ආයතන ශාඛාව හා විදුහල්පති ශාඛාව**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ඒ.ඩී.එස්. සදීකා මිය

**ගුරුමාරු ඒකකය -** අධ්‍යාපන අධ්‍යක්ෂ - පී. සලාහුදීන් මයා

**ගුරු ආයතන ශාඛාව - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්** - ආර්.ඩී.එම්.පී. වීරතුංග මයා

**ගුරු අධ්‍යාපනඥ සේවය - සහකාර ලේකම්** - ජේ. කේ.අතුකෝරල මිය

## පාසල් සැපයීම්, සේවා හා ඉදිකිරීම් අංශය

අතිරේක ලේකම් - අනුර දිසානායක මයා

**ගොඩනැගිලි කළමනාකරණ ශාඛාව -** ගොඩනැගිලි කළමනාකරු - ඒ.එච්.එච්.කේ. විරකෝන් මයා

**ප්‍රසම්පාදන ශාඛාව** - **ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්** - දීප්තිකා ගුණරත්න මිය

- ගණකාධිකාරී - දුනිල් හෙයියන්තුඩුව මයා

**පාසල් ගොඩනැගිලි ශාඛාව -** අධ්‍යක්ෂ - අයි.එම්. ප්‍රනාන්දු මිය

**පාසල් සැපයීම් ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.ඩී.සී. බියන්විල මයා

**පාසල් සැපයීම් ඒකකය -** ගණකාධිකාරී - දුනිල් හෙයියන්තුඩුව මයා

## සැලසුම් හා කාර්ය සාධන සමාලෝචන අංශය

අතිරේක ලේකම් - එස්.යූ. විජේරත්න මයා

**ගුරු අධ්‍යාපන හා විද්‍යාපීඨ ශාඛාව -** ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) - තිස්ස හේවාවිතාන මයා

**දත්ත කළමනාකරණ හා පර්යේෂණ ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩබ්.එස්. පෙරේරා මයා

**සැමට අධ්‍යාපන සහ සහශ්‍ර සංවර්ධන ඉලක්ක ශාඛාව**

අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.පී විතානගේ මිය

**විදේශ ආයතන හා විදේශ කටයුතු ශාඛාව** - අධ්‍යාපන අධ්‍යක්ෂ - එල්.ටී. ලාල් පද්මසිරි මයා

**මානව සම්පත් සංවර්ධන ශාඛාව** - අධ්‍යාපන අධ්‍යක්ෂ - පුෂ්පා විජේසූරිය මිය

**නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - ලලනි එන්.විජේසේකර මිය

**පිරිවෙන් ශාඛාව** - අධ්‍යාපන අධ්‍යක්ෂ - පූජ්‍ය වලස්වැවේ ඥාණරතන හිමි

**ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්.එම්.වේහැල්ල මිය

**පර්යේෂණ හා සංවර්ධන ශාඛාව -** අධ්‍යාපන අධ්‍යක්ෂ - සී. එම්.පී.ජේ.තිලකරත්න මිය

**උතුරු පළාත් අධ්‍යාපන සංවර්ධන සම්බන්දීකරණ ඒකකය**

අධ්‍යාපන අධ්‍යක්ෂ - ඒ.එම්.එෆ්.රාෆි මයා

**නීති ඒකකය** - නීති නිලධාරි - සුරංගි පෙරේරා මෙනවිය

**පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය -** අධ්‍යාපන අධ්‍යක්ෂ - අනුර ජයලත් ද සිල්වා මයා

**සංඛ්‍යා ලේඛන ශාඛාව -** ජ්‍යෙෂ්ඨ සංඛ්‍යා ලේඛනඥ - **කේ.එම්.ඩී.එස්.ඩී.කරුණාරත්න මිය**

**ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව** - අධ්‍යාපන අධ්‍යක්ෂ - පී.ආර්.පී.සිල්වා මිය

## විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය

**දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය** (EKSP)

ව්‍යාපෘති අධ්‍යක්ෂ - අනුර දිසානායක මයා

**ජර්මන් සහයෝගීතා සංවර්ධන ව්‍යාපෘතිය** (GIZ)

ව්‍යාපෘති අධ්‍යක්ෂ - එස්.මුරලිදරන් මයා

**ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව -** ලේකම් ජනරාල් - ආර්.පී. පෙරේරා මයා

## විගණන අංශය

**රජයේ විගණන ශාඛාව -** විගණන අධිකාරි - ඩබ්.එන්.පී.මැණිකේ මිය

**අභ්‍යන්තර විගණන ශාඛාව -** ගණකාධිකාරි - ඒ.ටී.කේ.අධිකාරි මිය

## පටුන


**පරිච්ඡේදය 1 ඃ අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ ව කෙටියෙන්** **01**
1.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය 01
1.2 අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන 01
1.3 පාසල් පිළිබඳ මූලික දත්ත - 2010 02

**පරිච්ඡේදය 2 ඃ සංවර්ධන ප්‍රවනතා** **05**
2.1 නව අධ්‍යාපන පනත 05
2.2 ප්‍රාථමික පාසල් 5000ක් සඳහා වන ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන 05
2.3 ආදර්ශ ද්විතීක පාසලක් - මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, පිටිපන, හෝමාගම. 08
2.4 ජාතික විභාග වල ශිෂ්‍ය සාධනය උසස් මට්ටමකට ගෙන ඒම 08
2.5 ජාතික හා ජාත්‍යන්තර විද්‍යා හා ගණිත ඔලිම්පියාඩ් තරගාවලිවල දී ලබාගත් ජයග්‍රහණ 08

**පරිච්ඡේදය 3 ඃ අධ්‍යාපන වියදම්** **09**
3.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් - 2011 09
3.2 අධ්‍යාපනය සඳහා විදේශ ආධාර ආයෝජන 10
3.2.1 ලෝක බැංකුව ආධාර සපයන ලද වැඩසටහන් හා ක්‍රියාකාරකම් 11
3.2.2. ආසියානු සංවර්ධන බැංකු ආධාර ලබන දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් සහ කාර්යයන් 11
ද්විතීයික පාසල් 1000 වැඩසටහන යටතට ගැනෙන පාසල් 104 ක් සංවර්ධනය කිරීම 11
• ඉටු කළ අනෙක් කාර්යයන් 12
3.2.3 යුනිසෙෆ් ආධාර ලද වැඩසටහන් 12
3.2.4 අනෙකුත් ආයතන වලින් ආධාර ලද වැඩසටහන් 12
3.3 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දේශීය හා අන්තර්ජාතික සංවර්ධන ආයතන සමඟ 2011 වර්ෂයේ දී අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම් 12
3.3.1 නැණස අධ්‍යාපන රූපවාහිනී 12
3.3.2 වෙබ් පාඨශාලා වැඩසටහන 12
3.3.3 අධ්‍යාපන කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පහසුකම් භාවිතය 12
3.3.4. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන සංවර්ධනය 13
3.3.5 'Partners in Learning' – මයික්‍රොසොෆ්ට් සහයෝගිතාව යටතේ ආධාර 13
3.3.6 "Intel World Ahead " වැඩසටහන - ඉන්ටෙල් වැඩසටහන ඉන්ටෙල් සහයෝගිතා ආධාර 13
3.3.7 'Oracle Think Quest' ඔරැකල් සහයෝගිතා ආධාර 14

**පරිච්ඡේදය 4 ඃ අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය වැඩි කිරීමේ වැඩසටහන** **15**
4.1 අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම 15
4.2 පාසල් නිලඇඳුම් සැපයීම 15
4.3 පාසල් පෙළපොත් සැපයීම 15
4.4 ශිෂ්‍යාධාර පිරිනැමීම 15
4.5 පාසල් දිවා ආහාර වැඩසටහන හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 15

**පරිච්ඡේදය 5 ඃ මානව සම්පත් සැපයීම සහ සංවර්ධනය** **17**
5.1 ගුරුවරු 17
5.1.1. ගුරුවරුන් බඳවා ගැනීම 17
5.1.2 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල සහ ගුරු විද්‍යාලවල සිදු කරන ආයතනික ගුරු පුහුණුව 18
5.1.3 අඛණ්ඩ ගුරු අධ්‍යාපනය 19
5.2 අධ්‍යාපන සංවර්ධන කළමනාකරණ නායකත්වය 19
5.3 උසස් ගුරු පිරිසක් බිහිකිරීම සඳහා ගුරු අධ්‍යාපනඥ සේවය 19

**පරිච්ඡේදය 6 ඃ භෞතික පහසුකම් සැපයීම** **21**
6.1 ගොඩනැගිලි ඉදිකිරීම 21
6.2 ඉගෙනුම් උපකරණ සැපයීම 21

**පරිච්ඡේදය 7 ඃ අධ්‍යාපන ආංශික සංවර්ධන ප්‍රවේශය හා අධ්‍යාපන අභිමතාර්ථ මුදුන් පමුණුවා ලීම** **23**
7.1 2012 - 2016 මධ්‍ය කාලීන සැලැස්ම පිළියෙල කිරීම 23
7.2 ප්‍රාථමික අධ්‍යපනය සඳහා ප්‍රවේශය 23
7.3 අධ්‍යාපනයෙහි ශිෂ්‍ය සහභාගීත්වය 23
7.4 ප්‍රාථමික අධ්‍යාපන චක්‍රය සම්පූර්ණ කිරීම 24
7.5. ගුරුවරුන්ගේ තත්ත්වය 24
7.6 ඉගෙනුම් ඵලවල තත්ත්වය 26

**පරිච්ඡේදය 8 ඃ අධ්‍යාපන සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය** **29**
8.1 ප්‍රාථමික අධ්‍යාපනය 29
8.2 ආගමික සහ සාරධර්ම අධ්‍යාපනය 29
8.3 පිරිවෙන් අධ්‍යාපනය 29
8.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය 30
8.5 ගණිත අධ්‍යාපනය 30
8.6 විද්‍යා අධ්‍යාපනය 31
8.7 ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය 32
8.8 ඉංග්‍රීසි සහ විදේශභාෂා අධ්‍යාපනය 32
8.9 ද්විභාෂා අධ්‍යාපනය 33
8.10 කෘෂිකර්ම හා පරිසර අධ්‍යාපනය 33
8.11 සෞන්දර්ය අධ්‍යාපනය 34
8.12 වාණිජ හා ව්‍යාපාර අධ්‍යයනය 34
8.13 ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය 34
8.14 විෂය සමගාමී මාර්ගෝපදේශ සහ උපදේශන වැඩසටහන් 35
8.15 පාසල් පුස්තකාල සංවර්ධනය 35
8.16 අන්තර්කරණ අධ්‍යාපනය තුළින් “සැමට අධ්‍යාපන” අවස්ථා පුළුල් කිරීම 35
8.17 ජාතික පාසල් සංවර්ධනය 35
8.18 උතුරු පළාතේ අධ්‍යාපන සංවර්ධනය 35
8.19 වතු පාසල් සංවර්ධනය 36
8.20 මුස්ලිම් පාසල් සංවර්ධනය 36
8.21 දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනය 36
8.22 නොවිධිමත් අධ්‍යාපනය 36
8.23 විශේෂ අධ්‍යාපනය 37

**පරිච්දෙය 9 ඃ අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සහ ගුණාත්මක බව තහවුරු කිරීම** **39**
9.1 පාසල් ඇගයීම සහ අධීක්ෂණය 39
9.2 අධ්‍යාපන පර්යේෂණ 39
9.3 අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (EMIS) 39

## වගු හා ප්‍රස්ථාර

වගුව 1.3.1 පාසල් සංඛ්‍යාවල ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරු සංඛ්‍යාව පළාත් අනුව 02
වගුව 1.3.2 පාසල් සංඛ්‍යාව වර්ගය අනුව 02
වගුව 1.3.3 පාසල් සංඛ්‍යාව ඉගැන්වීම් මාධ්‍ය අනුව 02
වගුව 1.3.4 පිරිවෙන් සංඛ්‍යාවල ගුරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව පළාත් අනුව 02
වගුව 1.3.5 පෞද්ගලික පාසල් සංඛ්‍යාවල ගුරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව 03
වගුව 2.2.1 ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු හා 2500 වැඩි පාසල් සංඛ්‍යාව හා ප්‍රතිශතය 2003-2010 05
වගුව 2.2.2 ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු පාසල්වල ගුරු, ශිෂ්‍ය සංඛ්‍යා හා ශිෂ්‍ය ගුරු අනුපාතය 05
වගුව 2.2.3 පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත්වීම අනුව පාසල් සංඛ්‍යාව - 2010 06
වගුව 2.2.4 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර 1AB පාසල් විසුරුම - 2010 06
වගුව 2.2.5 අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරා අනුව ශිෂ්‍ය සංඛ්‍යාව - 2010 07
වගුව 2.2.6 සංවර්ධනය කිරීම සඳහා ද්විතීයික පාසල් සහ ප්‍රාථමික පාසල් තෝරා ගෙන ඇති සංඛ්‍යාව පළාත් අනුව - 2011.12.31 දිනට 07
වගුව 3.1.1 මුදල් ප්‍රතිපාදන හා සත්‍ය වියදම (පුනරාවර්තන) - 2011 09
වගුව 3.1.2 මුදල් ප්‍රතිපාදන හා සත්‍ය වියදම (ප්‍රාග්ධන) - 2011 10
වගුව 3.1.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමෙහි සාරාංශය 10
වගුව 3.2.1 විදේශාධාර ආයෝජනය - 2011 11

| | | |
|---|---|---|
| වගුව 5.1.1 | ගුරුවරුන් සහ උපාධිධාරීන් බඳවා ගැනීම (2005 – 2011) | 17 |
| ප්‍රස්ථාරය 5.1.1 | රජයේ පාසල්වල ගුරුවරුන්ගේ වර්ධනය (2005 – 2010) | 17 |
| වගුව 5.1.2 | දළ ශිෂ්‍ය ගුරු අනුපාතය දිස්ත්‍රික් අනුව | 18 |
| වගුව 5.2.1 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් අවශ්‍ය හා සිටින සංඛ්‍යාවන් -2011 | 19 |
| වගුව 7.2.1 | වයස අවු. 5-11 ශිෂ්‍යයන්ට නිවසේ සිට පාසලට ඇති දුර | 23 |
| වගුව 7.3.1 | ප්‍රාථමික අධ්‍යාපනය සඳහා දළ සහ ශුද්ධ ලේඛනගත අනුපාතය | 23 |
| ප්‍රස්ථාරය 7.3.1 | ප්‍රාථමික අධ්‍යාපනයේ ශුද්ධ ලේඛනගත අනුපාතය 1996 – 2006 | 24 |
| වගුව 7.4.1 | ශිෂ්‍ය රැඳීසිටීමේ අනුපාතය – 2008 | 24 |
| වගුව 7.5.1 | ගුරුවරුන් ලත් උසස්ම අධ්‍යාපන සුදුසුකම අනුව ප්‍රතිශතය - 2010 | 25 |
| වගුව 7.6.1 | පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හා අ.පො.ස. (උසස් පෙළ) විභාගවලදී ශිෂ්‍ය සාධනය 2007 – 2011 | 26 |
| වගුව 7.6.2 | ප්‍රාථමික අංශයේ 4 වන ශ්‍රේණියේ ශිෂ්‍යයන් ඉගෙනුම් ඵල පිළිබඳ ජාතික ඇගයීමේ දී දැක් වූ සාධනය 2003-2009 | 26 |
| වගුව 7.6.3 | කණිෂ්ඨ ද්විතීයික අංශයේ 8 වන ශ්‍රේණියේ ශිෂ්‍යයන් ඉගෙනුම් ඵල පිළිබඳ ජාතික ඇගයීමේදී දැක් වූ සාධනය 2005-2009 | 26 |
| ප්‍රස්ථාරය 7.6.1 | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හර විෂයයන් හි ශිෂ්‍ය සාධනය 2008- 2011 | 27 |
| වගුව 7.6.4 | අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ශිෂ්‍ය සාධනය විෂයය සහ මාධ්‍ය අනුව -2010 | 27 |
| වගුව 8.1 | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයන්හි ශිෂ්‍ය සාධනය - 2008-2011 | 30 |
| ප්‍රස්ථාරය 8.1 | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිත විෂයය සමත්වීමේ ප්‍රතිශතය – 2011 | 31 |
| ප්‍රස්ථාරය 8.2 | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විද්‍යාව විෂයය සමත්වීමේ ප්‍රතිශතය – 2011 | 31 |
| ප්‍රස්ථාරය 8.3 | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සමත්වීමේ ප්‍රතිශතය – 2011 | 32 |

# පරිච්ඡේදය 1 ඃ
# අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ ව කෙටියෙන්

**දැක්ම**

ශ්‍රී ලාංකිය අනන්‍යතාවයේ හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මඟින් ජාත්‍යන්තර සමාජයේ විශිෂ්ඨත්වය කරා එළඹීම

**මෙහෙවර**

පාර්ශ්වකරුවන් තෘප්තිමත් භාවයට පත්වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මක භාවයට යොමුවන අධ්‍යාපනයේ නවීකරණය කරන ලද හා නූතන ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන පරිදි දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම

## 1.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

- ජාතික අභිමතාර්ථ, අරමුණු හා ප්‍රතිපත්තිවලට අනුගත ව අධ්‍යාපන සංවර්ධන කාර්යයන් සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම, නියමනය, ප්‍රගති සමාලෝචනය සහ ඇගයීම.
- අධ්‍යාපන සංවර්ධනය සඳහා ප්‍රමිති නිර්ණය කිරීම සහ එම ප්‍රමිති පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම වෙනුවෙන් පාසල් සහ අධ්‍යාපන ආයතනවල නිර්මාණාත්මක වැඩසටහන් දිරිගැන්වීම.
- අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාවට නැංවීමට හා පරිපාලන හා කළමනාකරණ කාර්යයන් විධිමත්ව පවත්වා ගැනීමට පළාත් අධ්‍යාපන බලධාරීන් සමඟ මනා සම්බන්ධීකරණය.
- ආධාර ආයතනවල සහාය ලබාදෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය
- ඉගෙනුම් උපකරණ, පාසල් ගොඩනැගිලි හා ලීබඩු සඳහා ප්‍රතිමාන සහ පිරිවිතර සකස් කිරීම.
- සියලු ම සිසුන්ට පාසල් නිල ඇඳුම් සැපයීම සහ අඩු ආදයම්ලාභී දක්ෂ සිසුන්ට ශිෂ්‍යාධාර ලබා දීම.

## 1.2 අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- ජාතික අධ්‍යාපන ආයතනය
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
- ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

## 1.3 පාසල් පිළිබඳ මූලික දත්ත - 2010

**වගුව 1.3.1 : පාසල් සංඛ්‍යාව, ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරු සංඛ්‍යාව පළාත් අනුව**

| පළාත් | පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | ගුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | 1338 | 915,872 | 40,460 |
| මධ්‍යම | 1466 | 522,293 | 30,629 |
| දකුණ | 1099 | 504,171 | 29,357 |
| උතුර | 840 | 239,633 | 13,417 |
| නැගෙනහිර | 1003 | 385,506 | 20,301 |
| වයඹ | 1218 | 472,836 | 27,219 |
| උතුරු මැද | 780 | 254,464 | 14,720 |
| ඌව | 839 | 277,116 | 18,243 |
| සබරගමුව | 1102 | 368,181 | 21,726 |
| **ශ්‍රී ලංකා** | 9685 | 3,940,072 | 216,072 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2010*

**වගුව 1.3.2 : පාසල් සංඛ්‍යාව වර්ගය අනුව**

| වර්ගය අනුව | 1AB | 1C | 2 වර්ගය | 3 වර්ගය | එකතුව |
|---|---|---|---|---|---|
| **පාසල් සංඛ්‍යාව** | 716 | 2,005 | 4,094 | 2,870 | 9,685 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2010*

**වගුව 1.3.3 : පාසල් සංඛ්‍යාව ඉගැන්වීම් මාධ්‍ය අනුව**

| මාධ්‍යය | සිංහල | දෙමළ | සිංහල සහ දෙමළ | සිංහල සහ ඉංග්‍රීසි | දෙමළ සහ ඉංග්‍රීසි | සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **පාසල් සංඛ්‍යාව** | 6,390 | 2,783 | 45 | 327 | 106 | 34 | 9,685 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2010*

**වගුව 1.3.4 : පිරිවෙන් සංඛ්‍යාව, ගුරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව පළාත් අනුව**

| පළාත් | පිරිවෙන් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | ගුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | 146 | 14,145 | 1,327 |
| මධ්‍යම | 103 | 7,639 | 725 |
| දකුණ | 157 | 12,817 | 1,341 |
| උතුර | 1 | 271 | 20 |
| නැගෙනහිර | 22 | 1,226 | 128 |
| වයඹ | 95 | 8,805 | 842 |
| උතුරු මැද | 55 | 4,268 | 432 |
| ඌව | 72 | 6,181 | 605 |
| සබරගමුව | 79 | 7,509 | 709 |
| **එකතුව** | **720** | **62,861** | **6,129** |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2011*

**වගුව 1.3.5 : පෞද්ගලික පාසල් සංඛ්‍යාව, ගුරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පළාත් | විශේෂ පාසල් ද ඇතුළත් ව පෞද්ගලික පාසල් සංඛ්‍යාව | | | ශිෂ්‍ය සංඛ්‍යාව | ගුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | ගාස්තු අය කරන | ගාස්තු අය නොකරන | එකතුව | | |
| බස්නාහිර | 30 | 24 | 54 | 87,511 | 4,317 |
| මධ්‍යම | 6 | 6 | 12 | 11,761 | 668 |
| දකුණ | 11 | 2 | 13 | 6,697 | 356 |
| උතුර | 4 | 2 | 6 | 8,659 | 349 |
| නැගෙනහිර | 1 | 0 | 1 | 30 | 7 |
| වයඹ | 3 | 0 | 3 | 958 | 94 |
| උතුරු මැද | 1 | 1 | 2 | 215 | 23 |
| ඌව | 2 | 3 | 5 | 1,381 | 154 |
| සබරගමුව | 2 | 0 | 2 | 150 | 26 |
| **එකතුව** | **60** | **38** | **98** | **117,362** | **5,994** |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2010*



ගුරු ප්‍රතිභා ප්‍රණාම උළෙල

2011 සමස්ත ලංකා පාසල් ක්‍රීඩා උළෙල






විභාග වලටඉදිරිපත් වන සිසුන් වෙනුවෙන් ආගමික ආශිර්වාද වැඩසටහන්

# පරිච්ඡේදය 2 ඃ
# සංවර්ධන ප්‍රවනතා

## 2.1 නව අධ්‍යාපන පනත

ආචාර්ය පී.බී. ගුණවර්ධන කමිටුව විසින් සකස් කරන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා මාලාව අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් විශේෂ උපදේශක කමිටුවක් මගින් තවදුරටත් අධ්‍යයනය කරන ලදී. මෙම කමිටුව විසින් අමාත්‍යවරුන්, පළාත් අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, පූජ්‍ය පක්ෂය, අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරුන්, ගුරු සංගම් නියෝජිතවරුන් ඇතුළු රැසකගේ අදහස් ලබාගෙන නව අධ්‍යාපන පනත කෙටුම්පත් කිරීමේ කාර්යය ආරම්භ කර ඇත.

## 2.2 ප්‍රාථමික පාසල් 5000ක් සඳහා වන ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩටහන

- **හැඳින්වීම හා පසුබිම**

අධ්‍යාපන ක්ෂේත්‍රයේ අප රට අත්පත් කර ගෙන ඇති සුවිශේෂී ජයග්‍රහණයන් රැසක් මධ්‍යයේ අද අප මුහුණපා ඇති එක් ගැටළුවක් වනුයේ ගම්බද පාසල් වැසීයාම හා නාගරික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව විශාල ලෙස වැඩිවීමයි. මෙලෙස පාසල් ධ්‍රැවීකරණයවීම, අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය පසුබෑමට ලක්වන කරුණක් වී ඇත. ගුරු උපයෝගීතාව දුර්වලම, සම්පත් අසමතුලිත ව බෙදීයාම, ගුණාත්මක ඉගෙනුම් ක්‍රියාවලිය අඩපණවීම යන ගැටළු, පාසල් ද්විධ්‍රැවීකරණයවීම තුළින් මතු ව ඇති අතර, එම ගැටළුවලට කඩිනමින් විසඳුම් සෙවීමේ අවශ්‍යතාවයට අප යොමුකර ඇත.

**වගුව 2.2.1 ඃ ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු හා 2500 වැඩි පාසල් සංඛ්‍යාව හා ප්‍රතිශතය 2003 - 2010**

| | 2003 | | 2007 | | 2010 | |
|---|---|---|---|---|---|---|
| | පාසල් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස | පාසල් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස | පාසල් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස |
| ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු | 1437 | 14.7 | 1533 | 15.8 | 1552 | 16.0 |
| ශිෂ්‍ය සංඛ්‍යාව 2500 ට වැඩි | 141 | 1.4 | 167 | 1.7 | 187 | 1.9 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2010*

**වගුව 2.2.2 ඃ ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු පාසල්වල ගුරු, ශිෂ්‍ය සංඛ්‍යා හා ශිෂ්‍ය ගුරු අනුපාතය**

| පාසල් සංඛ්‍යාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු ගුරුවරු සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යා ව ප්‍රතිශතයක් ලෙස | මෙම පාසල්වල ගුරු ශිෂ්‍ය අනුපාතය | සමස්ත පාසල්වල ගුරු ශිෂ්‍ය අනුපාතය |
|---|---|---|---|---|---|
| 1,552 | 43,753 | 8,080 | 16 | 5:1 | 18:1 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2010*

මෙම ගැටළු සහගත තත්ත්වය මගහැරවීම සඳහාත් ආචාර්ය සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මැතිතුමා හඳුන්වාදුන් නිදහස් අධ්‍යාපනයේ විපුල ඵල සියලු ම දරුවන්ට සමාන ලෙස භුක්ති විඳීමේ අවස්ථාව ලබාදීම උදෙසාත්, ද්විතීයික පාසල් හා ප්‍රාථමික පාසල් ජාලය සංවර්ධනය කිරීම වර්තමානයේ අතිශයින් වැදගත් හා කල් නොයවා ක්‍රියාත්මක කළ යුතු කාර්යයක් බවට පත් ව ඇත. මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි සඳහන් පංචබල කේන්ද්‍රීය සංවර්ධන ක්‍රමෝපායයන් අතරින් දැනුම්

කේන්ද්‍රය මත පදනම් ව අනාගතයට ගැළපෙන ශිෂ්‍ය පරපුරක් බිහිකිරීම සඳහා අංග සම්පූර්ණ ද්විතීයික පාසල් 1000ක් හා ඒ හා බැඳි ප්‍රාථමික පාසල් 5000ක් සංවර්ධනය කිරීම මෙහිලා අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන නව වැඩසටහනයි.

- **වැඩසටහනේ අභිමතාර්ථය**

විශ්ව ගම්මානයේ ක්‍රියාශීලී පුරවැසියන් වීමට අවශ්‍ය දැනුම හා කුසලතා අත්පත් කර ගැනීමට ඉඩකඩ සලසාලමින් සියලු ම දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනය ලැබීමට සම අවස්ථා සහතික කිරීම.

- **අරමුණු**

i. පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම හා සම්බන්ධ වර්තමාන ගැටළු මගහැරවීම

පහත වගුවෙන් පෙන්වනුයේ දිවයිනේ පළමු ශ්‍රේණිය සහිත පාසල් 9314 අතරින් 2149කට ම 2010 වර්ෂයේ ශිෂ්‍යයන් ඇතුළත් ව ඇත්තේ 10ට අඩු සංඛ්‍යාවක් බවයි. එකදු ශිෂ්‍යයෙක්වත් ඇතුළත් නොවූ පාසල් 306 ක් ඇත. එමෙන් ම ශිෂ්‍යයන් 10ත් 40ත් අතර ඇතුළත් ව ඇති පාසල් සංඛ්‍යාව 4531කි. එනම් සියලු ම පාසල් අතරින් හතරෙන් තුනක පමණ ඇත්තේ පළමු ශ්‍රේණියේ ශිෂ්‍යයන් 40ට අඩුවෙනි. මේ අතර පළමු ශ්‍රේණියේ ශිෂ්‍ය සංඛ්‍යාව 200කටත් වඩා සිටින පාසල් 170ක් ද ඇත. ප්‍රාථමික පාසල් ජාලය සංවර්ධනය කර මෙලෙස අඩු ශිෂ්‍ය ජනගහනයක් සහිත පාසල් වැසී යා නොදී රැකගැනීම වැඩසටහනේ අරමුණකි.

### වගුව 2.2.3: පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත්වීම අනුව පාසල් සංඛ්‍යාව - 2010

| පළමු ශ්‍රේණියේ ශිෂ්‍ය සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| **0** | 306 | 3.3 |
| **1-9** | 2149 | 23.0 |
| **10-40** | 4531 | 48.6 |
| **41-200** | 2158 | 23.1 |
| **200ට වැඩි** | 170 | 1.8 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2010*

ii. අ.පො.ස.(උසස් පෙළ) විද්‍යා අධ්‍යාපනය හැදෑරීම සඳහා ශිෂ්‍යයන්ට සමාන අවස්ථා සැපයීම

පහත වගුව අනාවරණය කරනුයේ එකදු 1AB පාසලක් (අ.පො.ස.(උසස් පෙළ) විද්‍යාධාරාව සහිත පාසලක්)වත් නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ක් දිවයිනේ පවතින බව ය. එක් 1AB පාසලක් හෝ පාසල් දෙකක් සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව 157කි. ඒ අනුව දිවයිනේ 1AB පාසල් විසිරුම ප්‍රාදේශීය වශයෙන් සමාන නොවන බව පෙනී යයි. නව වැඩසටහන අඩු ම වශයෙන් අංග සම්පූර්ණ ද්විතීයික පාසල් 03ක් වත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අයත් වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ල ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

**වගුව 2.2.4 ඃ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර 1AB පාසල් විසුරුම** - 2010

| ප්‍රා.ලේ. කොට්ඨාසයේ ඇති 1AB පාසල් ගණන | ප්‍රා.ලේ. කොට්ඨාස ගණන |
|---|---|
| **එකක්වත් නොමැති** | 72 |
| **1 ක් පමණක් ඇති** | 100 |
| **2 ක් පමණක් ඇති** | 57 |
| **3 ක් පමණක් ඇති** | 30 |
| **4 ක් පමණක් ඇති** | 25 |
| **5– 10 අතර ඇති** | 36 |
| **11 – 23 අතර ඇති** | 04 |
| **එකතුව** | **324** |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2010*

2.2.5. වගුවට අනුව අ.පො.ස(උසස් පෙළ) විද්‍යා හා වාණිජ අංශවල මුළු ශිෂ්‍ය ප්‍රතිශතය සමස්ත අ.පො.ස(උසස් පෙළ) ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂ ව සියයට 47.7 කි. සිසුන්ගෙන් සියයට 52.3 ක් ම ඉගෙනුම ලබනුයේ කලා ධාරාවෙනි. වර්තමාන ගෝලීය අවශ්‍යතාවලට ගැළපෙන පුරවැසියන් පිරිසක් බිහිකිරීම සඳහා විද්‍යා හා වාණිජ අංශ වලින් අධ්‍යාපනය හැදෑරීමට යොමුවන ශිෂ්‍ය ප්‍රතිශතය අඩු වශයෙන් සියයට 75 දක්වා වත් වැඩි කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ අපේක්ෂාවයි.

වගුව **2.2.5 : අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරා අනුව ශිෂ්‍ය සංඛ්‍යාව** - 2010

| පළාත් | අ.පො.ස (උසස් පෙළ) හදරන ශිෂ්‍ය ප්‍රතිශතය | | |
|---|---|---|---|
| | *විද්‍යා* | *වාණිජ* | *කලා* |
| බස්නාහිර | 27.2 | 36.2 | 36.6 |
| මධ්‍යම | 20.3 | 25.2 | 54.5 |
| දකුණ | 27.5 | 23.0 | 49.5 |
| උතුර | 18.5 | 15.1 | 66.4 |
| නැගෙනහිර | 17.2 | 17.5 | 65.3 |
| වයඹ | 20.0 | 20.7 | 59.3 |
| උතුරු මැද | 19.0 | 21.3 | 59.7 |
| ඌව | 17.2 | 21.6 | 61.2 |
| සබරගමුව | 22.1 | 23.2 | 54.7 |
| **එකතුව** | 22.5 | 25.2 | 52.3 |

*මුලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2010*

iii. පාසලෙන් අතරමැද සිසුන් ගිලිහීම වළක්වාලීම

අප පාසල් පද්ධතියේ 9 වන ශ්‍රේණිය දක්වා ශිෂ්‍යයන් රැඳී සිටීමේ අනුපාතය ගැහැණු ළමුන් සඳහා සියයට 89ක් ද පිරිමි ළමුන් සඳහා සියයට 93ක් ද පමණ වන අතර, සමස්තයක් ලෙස සියයට 9ක් සිසුන් අනිවාර්ය අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට පෙර පාසලෙන් ඉවත්වන බව පෙනේ. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් පසු පාසල් හැරයන ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂික ව 177,000 පමණ වේ. එසේම අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් පසු උසස් අධ්‍යාපන සුදුසුකම් නොලබා පාසල් හැර යන සංඛ්‍යාව වාර්ෂිකව 86,000 ක් පමණ වේ. අ.පො.ස. (සාමාන්‍ය පෙළ)ට පෙර පාසලෙන් ගිලිහීම සම්පූර්ණයෙන් ම වැලැක්වීමටත්, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. ( උසස් පෙළ)න් පසු ව වැඩිදුර අධ්‍යාපනයට සුදුසුකම් නොලබා පාසල් හැරයන්නන් විධිමත් වෘත්තීය පුහුණුවකට යොමු කිරීමටත් ද්විතීයික පාසල් පදනම් කරගත් වැඩ පිළිවෙලක් සැලසුම් කරනු ලැබේ.

- **වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

  - **වගුව 2.2.6 : සංවර්ධනය කිරීම සඳහා ද්විතීයික පාසල් සහ ප්‍රාථමික පාසල් තෝරා ගෙන ඇති සංඛ්‍යාව පළාත් අනුව -2011.12.31 දිනට**

| පළාත් | තෝරාගෙන ඇති පාසල් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | ජාතික පාසල් | පළාත් පාසල් | මුළු ද්විතීයික පාසල් සංඛ්‍යාව | ප්‍රාථමික පාසල් සංඛ්‍යාව |
| බස්නාහිර | 18 | 117 | 135 | 539 |
| මධ්‍යම | 33 | 123 | 156 | 395 |
| දකුණ | 39 | 96 | 135 | 506 |
| උතුර | 12 | 113 | 125 | 474 |
| නැගෙනහිර | 18 | 110 | 128 | 395 |
| වයඹ | 19 | 109 | 128 | 379 |
| උතුරු මැද | 8 | 74 | 82 | 470 |
| ඌව | 28 | 67 | 95 | 351 |
| සබරගමුව | 22 | 93 | 114 | 504 |
| **එකතුව** | 197 | 902 | 1,098 | 4,013 |

*මුලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව එක් ව සිදු කරන ලද සිතියම්කරණ අභ්‍යාසයක් මගින් පාසල් තෝරා ගැනීම සිදුකරන ලදී. මේ පිළිබඳ ව ප්‍රාදේශීය දේශපාලන බලධාරීන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන්, ශිෂ්‍යයන් සහ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකු කණ්ඩායම් සමග පවත්වන ලද සාකච්ඡාවලින් පසු ලෝක බැංකුව ඇ.ඩො. මිලියන 100 ක් ද, ආසියානු සංවර්ධන බැංකුව ඇ.ඩො.200 ක් ද මෙම වැඩසටහනට ලබාදීමට එකඟ ව ඇත. විදුහල්පතිවරුන් දහසක් සහ ගුරුවරුන් තුන් දහසක් මෙම පාසල්වල සේවය කිරීම සඳහා බඳවාගැනීමට අවශ්‍ය මූලික පියවර 2011 වර්ෂයේ දී ගනු ලැබිණි. මෙම විදුහල්පතිවරුන්ට විශේෂ නායකත්ව පුහුණුවක් ලබාදීමට ද සැලසුම් කර ඇත.

## 2.3 ආදර්ශ ද්විතීයික පාසලක් ලෙස හෝමාගම, පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලයය

හෝමාගම පිටිපන ප්‍රදේශයේ 2011 ජනවාරි 20 දින ආරම්භ කරන ලද මහින්ද රාජපක්ෂ විද්‍යාලයය ද්විතීයික පාසලක් ලෙස නව මානයක් ඔස්සේ ඇරඹීම ශ්‍රී ලාංකිය අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස පෙන්වා දිය හැක. සම්ප්‍රදායික පාසල් මෙන් නොව දිනපතා ප.ව. 3.30 වන තුරු පාසල පැවැත්වීම මෙම පාසලේ ඇති සුවිශේෂී ලක්ෂණයකි. මෙම කාලය තුළ විෂය සම්බන්ධ මෙන් ම, විෂය සමගාමී ක්‍රියාකාරකම් ද රැසක් ශිෂ්‍යයන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම පාසලට ඇතුළත් කරගනු ලබනුයේ 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළ ම දස්කම් දැක් වූ සිසුන් සහ විෂය සමගාමී කටයුතුවල විශේෂ දක්ෂතා දැක් වූ සිසුන් ය. මෙම පාසල සඳහා රු.මි. 15ක් වටිනා බස් රථයක් ජපන් ජාතික ආචාර්ය ඉතෝකියෝ මහතා ඇතුළු සුහපතන්නන් කණ්ඩායමක් විසින් පිරිනැමීම විශේෂයෙන් සඳහන් කළ යුතු යි.

## 2.4 ජාතික විභාග වල ශිෂ්‍ය සාධනය උසස් මට්ටමකට ගෙන ඒම

- පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය අධ්‍යාපන අමාත්‍යාංශය විභාග දෙපාර්තමේන්තුව සමග එක් ව ශිෂ්‍යයන්ට බරක් නොවන පරිදි, පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීමට පියවර ගන්නා ලදී. මෙම විභාගය ප්‍රාථමික අවධියේ අවසන් වසරේ ශිෂ්‍ය ඇගයීමක් ලෙස භාවිතයට ගෙන ලකුණු 70 ට වඩා වැඩියෙන් ලබා ගන්නා ශිෂ්‍යයන්ට සහතිකයක් ලබා දීමට කටයුතු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2007 දී 58.7% ක් ලෙස පැවති ලකුණු 70 ට වඩා වැඩියෙන් ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය 2011 දී 64.9% දක්වා වර්ධනය විය.

- අ.පො.ස (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාග : අධ්‍යාපන අමාත්‍යාංශය හා විභාග දෙපාර්තමේන්තුව එක් ව සිදු කරන ලද පහත සඳහන් වැඩසටහන් අ.පො.ස (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල 2010 හා 2011 වර්ෂවල වැඩිවීමට ඉවහල් විය.

  - ආදර්ශ ප්‍රශ්නපත්‍ර ශිෂ්‍යයන්ට ලබාදීම
  - හර විෂයයන් සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා ආදර්ශ පිළිතුරු කට්ටල සකස් කර ශිෂ්‍යයන්ට ලබාදීම.
  - අ.පො.ස (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාග සඳහා ශිෂ්‍යයන් සූදානම් කිරීමට සම්මන්ත්‍රණ දිවයින පුරා පැවැත්වීම.
  - විභාග ප්‍රශ්න පත්‍ර සකස් කරන විද්වතුන් සමග සාකච්ඡා කර අවශ්‍ය උපදෙස් ලබාදීම.
  - ශිෂ්‍යයන් අඩු සාධනයක් පෙන්වන විද්‍යා හා ගණිත වැනි විෂයයන් හි සාධනය වැඩි කිරීම සඳහා විශේෂ වැඩසටහන් පැවැත්වීම.

මෙම ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් ලෙස අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත් ප්‍රතිශතය 2007 දී 51.5% සිට 2011 දී 60.8% දක්වා වැඩි විය. අ.පො.ස. (උසස් පෙළ) සමත් ප්‍රතිශතය 2007 දී 61.4% සිට 2010 දී 61.6% දක්වා යම් වැඩිවීමක් පෙන්විය.

## 2.5 ජාතික හා ජාත්‍යන්තර විද්‍යා හා ගණිත ඔලිම්පියාඩ් තරගාවලිවල දී ලබාගත් ජයග්‍රහණ

2011 වර්ෂයේ පැවති ජාතික හා ජාත්‍යන්තර විද්‍යා හා ගණිත ඔලිම්පියාඩ් තරගවල දී සුවිශේෂ දස්කම් දැක්වීමට අප ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සමත් වූහ. 6 හා 7 ශ්‍රේණි සඳහා පැවති ජාත්‍යන්තර විද්‍යා හා ගණිත ඔලිම්පියාඩ් තරගයේ දී ලෝකඩ පදක්කම් 7ක් අපගේ ශිෂ්‍යයින්ට හිමි විය. 8,9,10 ශ්‍රේණි සඳහා පැවති ජාත්‍යන්තර ගණිත තරගාවලියේ දී කේවල තරගයෙන් ලෝකඩ පදක්කම් 2 ක් ද, කණ්ඩායම් තරගයෙන් 2වන ස්ථානය ද අප රටට හිමිවිය. පිලිපීනයේ පැවති කණිෂ්ඨ විද්‍යා හා ගණිත ඔලිම්පියාඩ් තරගයේ දී සුවිශේෂී දස්කම් දක්වමින් රන් පදක්කම් 2 ක්, රිදී පදක්කම් 7 ක් හා ලෝකඩ පදක්කම් 2 ක් දිනා ගැනීමට ශිෂ්‍යාවෝ සමත් වූහ.

# පරිච්ඡේදය 3 ඃ
# අධ්‍යාපන වියදම්

## 3.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් - 2011

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2011 වර්ෂයේ සත්‍ය පුනරාවර්තන වියදම් රු.මි. 24,932 වු අතර, ප්‍රතිපාදනය වුයේ රු.මි. 25,709කි. මෙම ඉතිරිය සිදුවුයේ වියදම් අඩුකිරීම සඳහා ගනු ලැබූ විවිධ පියවරවල ප්‍රතිඵලයක් ලෙසිනි. ප්‍රාග්ධන වියදම් සැලකීමේ දී ප්‍රතිපාදනය වන රු.මි.5,378 හා වියදම වන රු.මි. 4,248 අතර රු.මි. 1000ක පමණ වෙනසක් පෙන්වන අතර, එයට ප්‍රධාන හේතුව වූයේ අග්‍රිම නිදහස් කිරීමේ දී සිදු වු ප්‍රමාදයන් ය. වියදම් පිළිබඳ විස්තර 3.1.1 හා 3.1.2 වගුවලින් දැක්වේ.

**වගුව 3.1.1 ඃ මුළු ප්‍රතිපාදන හා සත්‍ය වියදම (පුනරාවර්තන)** - 2011

| **ක්ෂේත්‍රය** | **ව්‍යාපෘතිය** | **සමස්ත ප්‍රතිපාදනය** 2011 | **සත්‍ය වියදම** 2011 |
|---|---|---|---|
| **1.** | *පරිපාලන වැඩසටහන* | | |
| | ඇමති කාර්යාලය | 54,378,886 | 47,887,033 |
| | පරිපාලන හා ආයතනික සේවා | 464,359,503 | 453,923,941 |
| **2.** | *සංවර්ධන වැඩසටහන* | | |
| | ප්‍රාථමික අධ්‍යාපන | 2,894,569,000 | 2,888,804,713 |
| | ද්විතීයික අධ්‍යාපන | 10,794,696,700 | 10,737,162,413 |
| | විශේෂ අධ්‍යාපන | 2,966,915,000 | 2,936,396,793 |
| | ප්‍රදානයන් හා ආධාර | 6,975,450,041 | 6,595,984,569 |
| | සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන | 16,695,000 | 5,795,670 |
| | ගුරු පුහුණු හා සංවර්ධන රාමුව | 1,231,161,300 | 971,783,155 |
| | සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා ආයතනික සහය | 311,700,000 | 294,532,000 |
| | **පුනරාවර්තන එකතුව** | **25,709, 925,430** | **24,932,270,287** |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

වගුව 3.1.2 : මුළු ප්‍රතිපාදන හා සත්‍ය වියදම (ප්‍රාග්ධන) - 2011

| ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය | සමස්ත ප්‍රතිපාදනය 2011 | සත්‍ය වියදම 2011 |
|---|---|---|---|
| 1. | *පරිපාලන වැඩසටහන* | | |
| | ඇමති කාර්යාලය | 28,576,180 | 23,951,579 |
| | පරිපාලන හා ආයතනික සේවා | 109,037,838 | 71,881,444 |
| 2. | *සංවර්ධන වැඩසටහන* | | |
| | ප්‍රාථමික අධ්‍යාපන | 377,850,000 | 273,142,064 |
| | ද්විතීයික අධ්‍යාපන | 1,821,097,523 | 1,262,627,907 |
| | විශේෂ අධ්‍යාපන | 30,920,949 | 18,631,688 |
| | ගුරු පුහුණු හා සංවර්ධන රාමුව | 119,445,434 | 80,578,478 |
| | සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා ආයතනික සහය | 31,000,000 | 26,603,000 |
| | *සංවර්ධන වැඩසටහන* | 2,860,352,475 | 2,491,470,737 |
| | **ප්‍රාග්ධන එකතුව** | **5,378,280,399** | **4,248,886,897** |
| | **පුනරාවර්තන හා ප්‍රාග්ධන එකතුව** | **31,088,205,829** | **29,181,157,184** |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

වගුව 3.1.3 : රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමෙහි සාරාංශය

| විස්තරය | ආරම්භක ශේෂය | වසරේ ලැබීම් | වසරේ ණය | 2011.12.31 ට ශේෂය |
|---|---|---|---|---|
| **සත්‍ය** | 1,862,139,299.34 | 716,245,158.56 | 801,533,164.07 | 1,776,851,293.83 |
| **නිර්දේශිත සීමා** | ……. | 721,500,000.00 | 710,000,000.00 | 2,300,000,000.00 |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

## 3.2 අධ්‍යාපනය සඳහා විදේශ ආධාර ආයෝජන

2011 වර්ෂයේ දී සෘජු ව අධ්‍යාපනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හරහා සිදු කළ විදේශාධාර ආයෝජනය රු.මි. 2039 පමණ විය. ආසියානු සංවර්ධන බැංකුව දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය හරහා විශාලතම ආයෝජනය සිදු කරන ලද අතර, ලෝක බැංකුව අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන හරහා දෙවැනි විශාලතම ආයෝජනය සිදු කරන ලදී. විදේශාධාර ආයෝජනය පිළිබඳ විස්තර 3.2.1. වගුවෙන් දැක් වේ.

වගුව 3.2.1 ෘ විදේශාධාර ආයෝජනය - 2011

| මූලාශ්‍රය | වැඩසටහන | වාර්ෂික ආයෝජනය 2011 රු.මි |
|---|---|---|
| **ආසියානු සංවර්ධන බැංකුව** | දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපාතිය | 1867.0 |
| **ලෝක බැංකුව** | අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන සඳහා ප්‍රදාන | 133.0 |
| **යුනිසෙෆ්** | වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම | 14.0 |
| **ජී.අයි.ඉසෙඩ්** | වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම | 10.5 |
| **යුනෙස්කෝ** | වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම | 11.7 |
| **සේව් ද චිල්ඩ්‍රන්** | වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම | 2.8 |
| **එකතුව** | | **2039.0** |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

## 3.2.1 ලෝක බැංකුව ආධාර සපයන ලද වැඩසටහන් හා ක්‍රියාකාරකම්

- පෝෂණ හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන යටතේ ගුරුවරුන් පුහුණු කිරීම හා ශිෂ්‍ය කඳවුරු පැවැත්වීම.
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් පුහුණු කිරීම.
- ඉංග්‍රීසි අධ්‍යාපන සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන්.
- ප්‍රාදේශීය ඉංග්‍රීසි සම්පත් මධ්‍යස්ථාන සඳහා උපකරණ සැපයීම.
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ විෂයට අදාළ පුහුණුව හා ධාරිතා වර්ධනය.
- නොවිධිමත් අධ්‍යාපන වැඩසහන් ක්‍රියාත්මක කරන වෘත්තිකයන්ගේ ධාරිතා වර්ධනය.
- ද්විභාෂා නොවන ගුරුවරු ද්විභාෂා ගුරුවරුන් ලෙස පුහුණු කිරීම.
- නුපුහුණු උපාධිධාරීන් පුහුණු කිරීම.
- අධ්‍යාපන ප්‍රමිතීන් හා ගුණාත්මක සංවර්ධනය පිළිබඳ විදුහල්පතිවරුන් දැනුවත් කිරීම.
- පාසල් බාහිර ඇගයීම් පිළිබඳ ව නිලධාරීන් පුහුණු කිරීම.
- පාසල් පුස්තකාල භාවිතය පිළිබඳ විදුහල්පතිවරුන්, ගුරු පුස්තකාලයාධිපතිවරුන් හා ගුරුවරුන් පුහුණු කිරීම.
- පාසල්වල භෞතික පහසුකම් පිළිබඳ සමීක්ෂණය.
- ගණිත ගුරුවරුන් ගේ ජ්‍යාමිතික දැනුම වර්ධනය සඳහා වැඩසටහන්
- ගණිත ගුරුවරුන්ගේ ඉගෙනුම් ක්‍රම වර්ධනය සඳහා වැඩසටහන්
- අ.පො.ස(උසස් පෙළ) විෂය නිර්දේශයේ ගැටළු හඳුනාගැනීම සඳහා වැඩසටහන
- පාසල්වලට විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය ලබාදීම.
- ජාතික විද්‍යා අධ්‍යාපන පස් අවුරුදු සැලැස්ම පිළියෙල කිරීම
- ප්‍රාථමික පාසල්වලට බහුතල ඉගැන්වීම් ක්‍රමවේදය හඳුන්වාදීම
- වතු පාසල් දියුණු කිරීම

## 3.2.2 ආසියානු සංවර්ධන බැංකු ආධාර ලබන දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් සහ කාර්යයන්

### *(a) ද්විතීයික පාසල් 1000 වැඩසටහන යටතට ගැනෙන පාසල් 104 ක් සංවර්ධනය කිරීම*

- ද්විතීයික පාසල් 1000 වැඩසටහන යටතට ගැනෙන පාසල් 104 ක් දරිද්‍රතා දර්ශකය මත පදනම්ව තෝරා ගන්නා ලදී. එක් පාසලකට රු.මි. 35 බැගින් වියදම් කරනු ලබන අතර, නව ගොඩනැගිලි තැනීම, පවත්නා ගොඩනැගිලි අලුත්වැඩියාව, වෙනත් යටිතල පහසුකම් සැපයීම සහ ලී බඩු හා විද්‍යා උපකරණ සැපයීමට මෙම මුදල් වැය කෙරේ.
- 2011 දී ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද ද්විතීයික පාසල් 15 ක් නිල වශයෙන් පවරා දෙනු ලැබූ අතර, තවත් පාසල් 20 ක ඉදිකිරීම් අවසන් කරන ලදී.
- ද්විතීයික පාසල් 65 කට අවශ්‍ය පරිගණක, ලී බඩු හා උපකරණ සැපයීම අවසන් කරන ලදී.

### (b) ඉටු කළ අනෙක් කාර්යයන්

- වෘත්තීය පුහුණු පාඨමාලා හදාරන ශිෂ්‍යයන් 5000 කට එක් ශිෂ්‍යයකුට රු. 10000 බැගින් වන සේ ශිෂ්‍යත්ව පිරිනැමීම.
- පාසල් පරිගණක මධ්‍යස්ථාන 425ක් තනා නිම කිරීම.
- පරිගණක ආශ්‍රිත ඉගෙනුම්/ජාත්‍යන්තර පරිගණක ධාවන බලපත්‍රය (CAL/ICDL) හැදෑරීම සඳහා ගුරුවරුන් 3600කට ශිෂ්‍යත්ව ලබාදීම.
- ජාත්‍යන්තර ප්‍රජානත තොරතුරු තාක්ෂණ බලපත්‍රය (IPICT) හැදෑරීම සඳහා ගුරුවරුන් 5000 කට ශිෂ්‍යත්ව ලබාදීම.
- ඉ- සිටිසන් (e-citizen) ශිෂ්‍යත්ව 3440 ක් අධ්‍යාපන නිලධාරීන්ට සහ විදුහල්පතිවරුන්ට ලබාදීම.

### 3.2.3 යුනිසෙෆ් ආධාර ලද වැඩසටහන්

- අන්තර්කරණ අධ්‍යාපනය සඳහා උපකරණ කට්ටලය නියාමන මට්ටමින් හඳුන්වාදීම.
- ග්‍රාමීය පාසල්වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම.
- සාක්ෂර උපදේශකවරුන්ගේ ධාරිතා වර්ධනය හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා ඉගෙනුම් උපකරණ සකස් කිරීම.
- ගුරු අධ්‍යාපනය සඳහා ළමා මිතුරු පාසල් සංකල්පය අන්තර්ගත කිරීම.
- නියාමනය සහ ඇගයීම පිළිබඳ ව නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය.

### 3.2.4 වෙනත් දේශීය හා විදේශීය ආයතන වලින් ආධාර ලද වැඩසටහන්

| | |
|---|---|
| **යුනෙස්කෝ** | අන්තර්කරණ අධ්‍යාපනය සඳහා ප්‍රාථමික ගුරුරුවරුන් පුහුණු කිරීමට මොඩියුලයක් සහ ඉ-ඉගෙනුම් පැකේජයක් සකස් කිරීම |
| **ජී.අයි.ඉසෙඩ්** | ගණිත ගුරුවරුන්ගේ ධාරිතා වර්ධනය<br>මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන් |
| **සේව් ද චිල්රන්** | ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර අධ්‍යාපනයට අදාළ කුසලතා වර්ධනය කිරීම<br>සාම අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| **ප්ලෑන් ශ්‍රී ලංකා** | 6 වන ශ්‍රේණිය ගණිතය ප්‍රතිකාර්ය වැඩසටහන ක්‍රියාත්මක කිරීම |
| **ඩී.එෆ්.සී.සී. බැංකුව** | පාසල් ඵලදයිතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම |
| **මාස් හෝල්ඩිංග්ස් ආයතනය** | තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය වැඩසටහන ක්‍රියාත්මක කිරීම |

## 3.3 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දේශීය හා අන්තර්ජාතික සංවර්ධන ආයතන සමඟ 2011 වර්ෂයේ දී අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම්

### 3.3.1 නැණස අධ්‍යාපන රූපවාහිනී

ඩයලොග් සමාගමේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ සහයෝගය ඇති ව නැණස රූපවාහිනී වැඩසටහන් විකාශනය සඳහා අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී. මේ යටතේ 2011 දී පාසල් 1000කට වර්ණ රූපවාහිනී යන්ත්‍ර සහ ඇන්ටෙනා, ඩයලොග් ආයතනය විසින් ලබදෙන ලදී.

### 3.3.2 වෙබ් පාඨශාලා වැඩසටහන

විද්‍යුත් ඉගෙනුම් භාවිතයන් ශිෂ්‍යයන් හා ගුරුවරුන් අතර ප්‍රචලිත කිරීමට හා ඒ සඳහා ආරක්ෂිත අන්තර්ජාල පහසුකම් ඔවුන්ට ලබාදීම මෙහි අරමුණයි.

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය, එටිසලාට් ආයතනය, රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව යන ආයතනයන් හා එක් ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. එටිසලාට් ආයතනය විසින් ලබාදෙන පහසුකම් ප්‍රයෝජනයට ගෙන පාසල් විෂයමාලාව අනුබද්ධිත විද්‍යුත් ඉගෙනුම් අන්තර්ගතයන්ට පිවිසීමට මේ යටතේ අවස්ථාව ලබා දේ. මෙම ව්‍යාපෘතිය හරහා අධ්‍යාපන අමාත්‍යාංශයට විෂයමාලා, ගිවිසුම්, ආකෘති ප්‍රශ්න පත්‍ර, ගුරු අත්පොත්, පුනරීක්ෂණ කට්ටල ඇතුළු ඕනෑම තොරතුරක් පහසුවෙන් හා ඉක්මණින් බෙදා හැරීමට හැකි වේ.

### 3.3.3 අධ්‍යාපන කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පහසුකම් භාවිතය

කොරියානු රජයේ ග්වැංජු මෙට්‍රොපොලිටන් අධ්‍යාපන ආයතනය විසින් අධ්‍යාපන කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය වැඩිකිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයට සහයදීමට එකඟ වී ඇත. එම ගිවිසුමේ අඩංගු කොන්දේසි පහත දැක්වේ.

- 2011 න් පටන්ගෙන වසර හතරක් යන තුරු පරිගණක 50 බැගින් ලබා දීම.
- කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා සම්පත් පුද්ගලයින් පුහුණු කිරීම
- තොරතුරු තාක්ෂණ ගුරුවරුන් සඳහා විශේෂ පුහුණුවක් ලබාදීම හා අනුග්‍රාහක වැඩසටහන් දියත් කිරීම.

### 3.3.4. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන සංවර්ධනය

කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය(කොයිකා) මගින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන සංවර්ධනය සඳහා රු.මි. 500ක මුදලක් ප්‍රදානය කිරීමට එකඟ විය. පන්ති කාමර 13 ක් සහ ගුරු නිවාස 12 ක් ඉදිකිරීම මේ යටතට ඇතුළත් ය.

### 3.3.5 'Partners in Learning' – මයික්‍රොසොෆ්ට් සහයෝගිතාව යටතේ ආධාර

- නිර්මාණශීලී ගුරුවරුන් හා ශිෂ්‍යයන් සඳහා නවෝත්පාදක මෘදුකාංග තරගය

දියුණු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය ශක්තිමත් කිරීම සඳහා ගුරුවරුන් සහ ශිෂ්‍යයන් තුළ නවෝත්පාදක තොරතුරු තාක්ෂණ නිපුණතා ඔප්නැංවිය විය යුතු බව හඳුනා ගෙන ඇත. මෙම අරමුණු ඉටු කරලීම සඳහා මයික්‍රොසොෆ්ට් සමාගම මෙම මෘදුකාංග තරගය පවත්වනු ලැබේ.

- නවෝත්පාදක පාසල් වැඩසටහන

උසස් මට්ටමේ ඉගෙනුමක් සඳහා ශිෂ්‍යයන්ට උපකාරීවන හවුල්කරුවන් හඳුනාගැනීමට සහ ඉගෙනුම සඳහා තාක්ෂණයන් හා අවශ්‍ය පරිසර නිර්මාණයන් කිරීමට මෙම වැඩසටහන මගින් පාසලට මග පෙන්වයි.

- ඉ - ගම්මාන සඳහා සහයෝගීතාව

ඉ - ගම්මානවල තරුණයන්ට රැකියා කේන්ද්‍ර කොටගත් කර්මාන්ත ආශ්‍රිත විෂයමාලාවක් සකස් කර පුහුණු කිරීම සඳහා තෝරාගත් ගුරුවරුන්ට වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- මල්ටිපොයින්ට් තාක්ෂණය විද්‍යාගාර 1250 ක් වැඩසටහන

ඉදිරිවර්ෂ 3 තුළ මයික්‍රොසොෆ්ට් තාක්ෂණය භාවිතයෙන් සිදු කරනු ලබන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සහ මල්ටිපොයින්ට් පන්ති කාමරවලට ප්‍රවේශවීමේ අවස්ථාව මේ යටතේ ගම්බද පාසල්වලට ලබාදෙයි.

### 3.3.6 "Intel World Ahead " වැඩසටහන - ඉන්ටෙල් වැඩසටහන ඉන්ටෙල් සහයෝගිතා ආධාර

- "ඉන්ටෙල් ටීච්" පුහුණු වැඩසටහන
- ඉගෙනුම් ක්‍රියාවලිය උසස් කිරීම සඳහා තාක්ෂණය කාර්යක්ෂම ව භාවිතයට ගුරුවරුන් යෙදවීම මෙමගින් සිදුකෙරේ.
- "ඉන්ටෙල් ටීච්" පාසල් සම්මාන කලාපීය තරගාවලිය
- මෙම තරගාවලිය මගින් තාක්ෂණය හොඳින් භාවිතා කිරීම , නිර්මාණශීලී බව හා නව චින්තනය අනුව විශිෂ්ඨත්වය පෙන්නුම් කරන පාසල්වලට සම්මාන ලබා දේ.
- ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සල්පිල හා ප්‍රදර්ශනය/ වසරේ කණිෂ්ඨ නිර්මාපකයා
- ජාතික විද්‍යා පදනම , ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය හා ඉන්ටෙල් ආයතනය එක් ව ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සල්පිල හා ප්‍රදර්ශනය පවත්වනු ලබන අතර, එහි අරමුණ වනුයේ පාසල් ශිෂ්‍යයන් හා තරුණයින් නව නිපයුම් බිහි කිරීමට දිරිමත් කිරීමයි. මෙහි දී ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් තෝරා ගෙන ජාත්‍යන්තර තරග නියෝජනය කිරීමට ඉදිරිපත් කෙරේ
- School.lk වෙබ් අඩවිය හරහා අංකිත අධ්‍යාපන අන්තර්ගතය
- මෙමගින් විද්‍යා/ගණිත ක්ෂේත්‍රයේ දක්ෂ ගුරුවරුන්ගේ විශේෂඥභාවය උපයෝගි කරගෙන ශිෂ්‍යයන් හා ගුරුවරුන් වෙනුවෙන් ඉගෙනුම් සම්පත් නිර්මාණය කිරීමටත්, වෙබ් අඩවිය හරහා ප්‍රවේශ පහසුකම් සැලසීමටත් පියවර ගනු ලැබේ.

### 3.3.7 'Oracle Think Quest' ඔරැකල් සහයෝගිතා ආධාර

- Think Quest - පුහුණු වැඩසටහන

මෙම වැඩසටහන රටවල් 43ක ගුරුවරු සහ ශිෂ්‍යයන් සාමුහික ඉගෙනුම් ක්‍රියාවලියක් කරා යොමු කරවන සහයෝගිතා වැඩසටහනකි. පන්ති කාමර විෂයමාලාව හැදෑරීමට අවශ්‍ය ඉඩකඩ හා සැලසුම් ඇතුළත් ඉගෙනුම් ව්‍යාපෘති සකස් කිරීමට ගුරුවරුන්ට හා ශිෂ්‍යයන්ට ඉඩකඩ සලසනු ලැබේ.

- Think Quest - ජාත්‍යන්තර තරගාවලිය

තින්ක් වෙස්ට් ව්‍යාපෘති, ඩිජිටල් මාධ්‍ය හා යෙදවුම් සංවර්ධනය යන අංශ 3 යටතේ තාක්ෂණය, අවධි චින්තනය සහ සන්නි-වේදන කුසලතා භාවිතයෙන් ගැටළු විසඳීමට ශිෂ්‍යයන් යොමු කිරීම මෙහි අරමුණ වේ.

- Think Quest Live - ජාත්‍යන්තර සමුළුව

ජයග්‍රාහී ශිෂ්‍යයන්ට ජාත්‍යන්තර අධ්‍යාපන වැඩසටහන් වලට, ක්‍රියාකාරකම්වලට, සමාජ වැඩසටහන්වලට අවස්ථාව ලබාදෙන දින 5ක වැඩසටහනක් ලෙස ඔරැකල් අධ්‍යාපන පදනම විසින් ක්‍රියාත්මක කෙරේ.

# පරිච්ඡේදය 4 :

# අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය වැඩි කිරීමේ වැඩසටහන

## 4.1 අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

වයස අවුරුදු 14 දක්වා සියලු ම ශිෂ්‍යයන් පාසලට ඇතුළත් කිරීම හා රඳවා ගැනීම සඳහා පාසල් පැමිණවීම් කමිටු පාසල් මට්ටමින් පිහිටුවා ගන්නා ලදී. 2011 වර්ෂයේ දී එවැනි කමිටු 8400 ක් ක්‍රියාත්මක විය.

## 4.2 පාසල් නිලඇඳුම් සැපයීම

2011 වර්ෂයේ දී රුපියල් මිලියන 1595 ක වියදමින් සියලු රජයේ පාසල්වල ශිෂ්‍යයන්ට නිල ඇඳුම් රෙදි සහ පිරිවෙන් වල පැවිදි ශිෂ්‍යයන්ට සිවුරු රෙදි පිරිනමන ලදී.

## 4.3 පාසල් පෙළපොත් සැපයීම

2011 වර්ෂයේ දී රු.මි. 1552 ක වියදමින් සියලු ම රජයේ පාසල්වල, පිරිවෙන්වල සිසුන්ට සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වල ගුරු සිසුන්ට පෙළපොත් සපයන ලදී.

## 4.4 ශිෂ්‍යාධාර පිරිනැමීම

පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළ ලකුණු ලබාගත් අඩු ආදයම් ලාභී ශිෂ්‍යයන් 15000 කට එක් ශිෂ්‍යයෙකුට මාසිකව රුපියල් 500 බැගින් ලබා දේ. අ.පො.ස. (උසස් පෙළ) ශිෂ්‍යයන් සඳහා මෙම දීමනාව රුපියල් 1500 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත.

## 4.5 පාසල් දිවා ආහාර වැඩසටහන හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය හා අනෙක් අදාළ ආයතන හා එක් ව සෞඛ්‍ය සම්පන්න , ක්‍රියා ශීලී, ශක්ති සම්පන්න ශිෂ්‍ය පරපුරක් බිහිකිරීමේ අරමුණින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරයි.

- පෝෂණ මට්ටම දියුණු කිරීම :

  2011 වර්ෂයේදී 6198 ක පාසල්වල ශිෂ්‍යයන් 731, 942 කට දිවා ආහාර සපයන ලදී. නිරක්තිය වැළැක්වීම සඳහා ශිෂ්‍යයන්ට යකඩ පෙති ලබාදීමට කටයුතු කරන ලදි.

- සෞඛ්‍ය සම්පන්න පාසල් පරිසරය :

  අවශ්‍ය පාසල්වලට සනීපාරක්ෂක පහසුකම්, ජල ටැංකි සහ වතුර ෆිල්ටර් ලබාදීමට පියවර ගන්නා ලදී. අංක 2007/21 සෞඛ්‍ය ප්‍රවර්ධන චක්‍රලේඛයට අනුව සාර්ථක භාවයට පත් පාසල් 659ක් කලාප 21 කින් තෝරාගෙන සහතික කිරීමකට ලක් කරන ලදී. සෞඛ්‍ය දැනුම වැඩිකිරීම සඳහා ශිෂ්‍ය කඳවුරු හා ගුරු පුහුණු වැඩසටහන් පවත්වන ලදී. සෞඛ්‍ය සම්පන්න ආහාර පරිභෝජන රටාවකට ශිෂ්‍යයන් යොමු කරවීමේ අරමුණ ඇති ව පාසල් ආපන ශාලා චක්‍රලේඛය (2011/03 දරණ) නිකුත් කරන ලදී.

- පාසල් වෛද්‍ය පරීක්ෂණය :

  2010 වර්ෂය තුළ පාසල් වෛද්‍ය පරීක්ෂණය පාසල් වලින් 83% ක් සම්පූර්ණ කරන ලදී සෞඛ්‍ය ගැටළු සහිත ශිෂ්‍යයන් මෙහි දී හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කරවන ලදී.

- එච්.අයි.වී. /ඒඩ්ස් තුරන් කිරීම :

  ශිෂ්‍ය කඳවුරු පැවැත්වීම හා මනෝ සමාජයීය කුසලතා සංවර්ධනය තුළින් පාසල් ශිෂ්‍යයන් දැනුවත් කිරීම සිදු කොට, එමගින් පාසල් ශිෂ්‍යයන් අතර වැරදි සහ අවදනම් සහගත චර්යාවන් අඩු කිරීමට පියවර ගන්නා ලදී.




2011 දී ආරම්භ කළ හෝමාගම පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලය

## ද්විතීයික පාසල් සංවර්ධන වැඩසටහනේ ප්‍රගතියෙන් බිඳක්



එදා



ත්‍රි/ අග්බෝපුර මහා විද්‍යාලය

අනු / කැබිතිගොල්ලෑව මධ්‍ය මහා විද්‍යාලය



අද



# පරිච්ඡේදය 5 ඃ
# මානව සම්පත් සැපයීම සහ සංවර්ධනය

## 5.1 ගුරුවරු

### 5.1.1. ගුරුවරුන් බඳවා ගැනීම


2011 දී අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් සභා මගින් ගුරුවරුන් ලෙස උපාධිධාරීන් හා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් 7358 ක් බඳවා ගන්නා ලදීග මේ අතරින් 2180ක් ජාතික පාසල් සඳහා දල 5178 ක් පළාත් සභා පාසල් සඳහා ද පත් කරන ලදීග 2005 සිට 2011 දක්වා ගුරුවරුන් සහ උපාධිධාරීන් අධ්‍යාපන ක්ෂේත්‍රයට බඳවා ගැනීම පිළිබඳ විස්තර පහත දැක්වේග

**වගුව 5.1.1 : ගුරුවරුන් සහ උපාධිධාරීන් බඳවා ගැනීම (2005 – 2011)**

| වර්ෂය | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගුරුවරුන් බඳවා ගැනීම | | | | පළාත් සභා විසින් උපාධිධාරීන් බඳවා ගැනීම | |
|---|---|---|---|---|---|---|
| | *ජාතික පාසල් සඳහා* | | *පළාත් සභා පාසල් සඳහා* | | | |
| | *උපාධිධාරී* | *ජාතික ශික්ෂණ ඩිප්ලෝමාධාරීන්* | *උපාධිධාරී* | *ජාතික ශික්ෂණ ඩිප්ලෝමාධාරීන්* | *ගුරු පත්වීම්* | *වෙනත් පත්වීම්* |
| **2005** | 2923 | 383 | 326 | 2326 | 1925 | -- |
| **2006** | 2444 | 887 | 960 | 2451 | 2960 | -- |
| **2007** | -- | 408 | 1490 | 2191 | 967 | 321 |
| **2008** | -- | 427 | 671 | 2191 | 3070 | 1119 |
| **2009** | 971 | 1307 | -- | 1613 | 1498 | 46 |
| **2010** | 584 | 829 | 132 | 2078 | 2368 | 62 |
| **2011** | 1090 | 1090 | 2198 | 835 | 2145 | 235 |
| **එකතුව** | **8012** | **5331** | **5777** | **13685** | **14933** | **1783** |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

**ප්‍රස්ථාරය 5.1.1: රජයේ පාසල්වල ගුරුවරුන්ගේ වර්ධනය 2005 - 2010**




*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

2010 පාසල් සංගණනය අනුව පද්ධතියේ ගුරුවරුන් 214,562 ක් සිටින අතර, සමස්ත ශිෂ්‍ය ගුරු අනුපාතය 18 ඃ 1 කි. සමස්තයක් ලෙස ගත් කළ මෙය ඉතා හොඳ තත්ත්වයක් වුව ද, දුෂ්කර පාසල් අනුව සහ ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව වැනි විෂයයන් අනුව බැලූ කළ ගුරු ඌනතා ඇත. ගුරුවරුන් තුලනය සිදු කිරීමට අවශ්‍ය ක්‍රමෝපාය කිහිපයක් දැනටමත් අධ්‍යාපන අමාත්‍යාංශය දියත් කර ඇත. පාසල් පාදක ගුරු පත්වීම් ලබාදීම හා දුෂ්කර ප්‍රදේශවලින් බඳවා ගන්නා ප්‍ර මාණය වැඩි කිරීම මේ අතරින් ප්‍රධාන වේ.

**වගුව 5.1.2: දළ ශිෂ්‍ය ගුරු අනුපාතය දිස්ත්‍රික් අනුව**

| දිස්ත්‍රික්කය | ශිෂ්‍ය /උපාධිගුරු අනුපාතය | ශිෂ්‍ය / පුහුණු ගුරු අනුපාතය | ශිෂ්‍ය නුපුහුණු ගුරු අනුපාතය | සමස්ත ශිෂ්‍ය / ගුරු අනුපාතය |
|---|---|---|---|---|
| කොළඹ | 49 | 45 | 1667 | 23 |
| ගම්පහ | 54 | 41 | 2547 | 23 |
| කළුතර | 52 | 37 | 812 | 21 |
| මහනුවර | 47 | 28 | 460 | 17 |
| මාතලේ | 44 | 27 | 400 | 16 |
| නුවරඑළිය | 75 | 30 | 101 | 18 |
| ගාල්ල | 52 | 31 | 1714 | 19 |
| මාතර | 40 | 27 | 1337 | 16 |
| හම්බන්තොට | 37 | 28 | 1881 | 16 |
| යාපනය | 42 | 35 | 273 | 18 |
| කිලිනොච්චිය | 66 | 28 | 534 | 19 |
| මන්නාරම | 67 | 32 | 208 | 19 |
| වව්නියාව | 64 | 25 | 379 | 17 |
| මුලතිව් | 53 | 23 | 631 | 15 |
| මඩකලපුව | 56 | 35 | 534 | 21 |
| අම්පාර | 62 | 25 | 347 | 17 |
| ත්‍රිකුණාමලය | 92 | 28 | 456 | 21 |
| කුරුණෑගල | 41 | 36 | 544 | 16 |
| පුත්තලම | 74 | 27 | 211 | 22 |
| අනුරාධපුර | 52 | 34 | 217 | 16 |
| පොලොන්නරුව | 56 | 25 | 272 | 19 |
| බදුල්ල | 46 | 31 | 169 | 15 |
| මොණරාගල | 44 | 31 | 138 | 16 |
| රත්නපුර | 50 | 26 | 424 | 18 |
| කෑගල්ල | 44 | 26 | 389 | 16 |
| ශ්‍රී ලංකාව | **50** | **31** | **390** | **18** |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

## 5.1.2 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල සහ ගුරු විද්‍යාලවල සිදු කරන ආයතනික ගුරු පුහුණුව

- 2012 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට නවක ගුරු සිසුන් 3100ක් බඳවාගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබිණි.
- අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට 415ක් උපාධිධාරී ගුරුවරුන් බඳවාගැනීම සඳහා ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.
- ළමා මිතුරු පාසල් ප්‍රවේශය සහ ළමා කේන්ද්‍රීය ඉගෙනුම පිළිබඳ ව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ගුරු අධ්‍යාපන පාඨමාලාවට අන්තර්ගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු ඉටුකරන ලදී.
- ගුරු විද්‍යාල සහ ගුරු පුහුණු මධ්‍යස්ථාන 31ක් හරහා නුපුහුණු උපාධිධාරීන් නොවන ගුරුවරුන් 7300ක් පුහුණු කිරීමට පියවර ගනු ලැබුණි.
- රජයේ ආධාර ලබන පෞද්ගලික පාසල් සහ පිරිවෙන්වල සේවය කරන නුපුහුණු ගුරුවරුන් 3500ක් පුහුණු කිරීමට සැලසුම් සකස් කරන ලදී.

### 5.1.3 අඛණ්ඩ ගුරු අධ්‍යාපනය

අධ්‍යාපන ආංශික සංවර්ධන ප්‍රදානයන් භාවිතා කොට ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධන පාඨමාලා ගුරු මධ්‍යස්ථාන 39ක දෙදින වැඩමුළු 95ක් හරහා පවත්වන ලදී.

## 5.2 අධ්‍යාපන සංවර්ධන කළමනාකරණ නායකත්වය

**වගුව 5.2.1 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් අවශ්‍ය හා සිටින සංඛ්‍යාවන් - 2011**

| 2011.12.31 දිනට | ශ්‍රී ලං.අ.ප.සේ1 | ශ්‍රී ලං.අ.ප.සේ11 | ශ්‍රී ලං.අ.ප.සේ111 | එකතුව |
|---|---|---|---|---|
| අවශ්‍ය | 200 | 300 | 1783 | 2283 |
| සිටින | 183 | 200 | 1285 | 1668 |

*මූලාශ්‍රයඃ අධ්‍යාපන අමාත්‍යාංශය*

- ශ්‍රී ලං.අ.ප.සේ III පන්තිය විශේෂ කාණ්ඩය යටතේ බඳවාගත් නිලධාරීන් 34 දෙනෙකුට (2007 දී) අවශ්‍ය පුහුණුව ලබාදෙන ලද අතර, 2012 දී බඳවාගනු ලබන නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබාදීමට සැලසුම් සකස් කර ඇත.
- ශ්‍රී ලං.අ.ප.සේ I පන්තියට උසස් කරන ලද (2010 දී) නිලධාරීන් 36 දෙනෙකුට කළමනාකරණය හා නායකත්ව පුහුණුව ලබාදීමට පියවර ගනු ලැබිණි.

## 5.3 උසස් ගුරු පිරිසක් බිහිකිරීම සඳහා ගුරු අධ්‍යාපනඥ සේවය

- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සංශෝධිත ව්‍යවස්ථාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා යවන ලදී.
- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I පන්තියට උසස්වීම් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.



අන්තර්ජාතික ගණිත හා
විද්‍යා ඔලිම්පියාඩ්
ජයග්‍රහණ ලද සිසුන්




පරිගණක විද්‍යාගාර ගම්බද
පාසල් වලට ද ලබා දී ඇත



පරිගණක තාක්ෂණය
ඉගෙනුම් ප්‍රවර්ධනය සඳහා
භාවිතා කිරීමට
සිසුන්ට ලැප්ටොප්
පරිගණක ලබා දීම

# පරිච්ඡේදය 6 :
# භෞතික පහසුකම් සැපයීම

## 6.1 ගොඩනැගිලි ඉදිකිරීම

- ප්‍රමාණවත් නොවු මුල්‍ය ප්‍රතිපාදන මත නවතා තිබූ ජාතික පාසල් 98ක ඉදිකිරීම් කාර්යයන් ආරම්භ කිරීමට හැකිවිය.
- ජාතික පාසල් ගුරු විද්‍යාල හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල හඳුනාගත් අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු කරන ලදී.
- හෝමාගම, පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලයයේ පන්ති කාමර 36ක ගොඩනැගිලි සංකීර්ණය හා ගුරු විවේකාගාරය තනා නිම කරන ලදී.
- දේශන කාමර 4ක් හා ශිෂ්‍යයන් 1200කට පහසුකම් සහිත පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ යෝජිත ශ්‍රවනාගාරය ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

## 6.2 ඉගෙනුම් උපකරණ සැපයීම

- මෙම වර්ෂයේ දී ඉලෙක්ට්‍රොනික පියානෝ 1936ක් පාසල්වලට බෙදාහරින ලදී. තවත් 863ක් බෙදාහැරීමට සැලසුම් කරන ලදී.
- විශේෂිත කළුලෑලි 30000 ක් බෙදාහැරීමට සැලසුම් කරන ලද අතර, ඉන් 9750ක් බෙදාහරින ලදී.
- ජර්මන් ආධාර මත ලද පුටු හා මේස ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ළමා ක්‍රියාකාරකම් මධ්‍යස්ථාන වෙත බෙදාහරින ලදී.



ප්‍රාථමික අධ්‍යාපනයේ ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම සඳහා දෙමාපිය සහභාගීත්වය



ළමා මිතුරු ප්‍රාථමික පාසලක සෙල්ලම් මිදුල



පාසල් ගොවිපොළක්

# පරිච්ඡේදය 7 :
# අධ්‍යාපන ආංශික සංවර්ධන ප්‍රවේශය හා අධ්‍යාපන අභිමතාර්ථ මුදුන් පමුණුවා ලීම

## 7.1 2012 - 2016 මධ්‍ය කාලීන සැලැස්ම පිළියෙල කිරීම

අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහනෙහි දෙවන පියවර වන මධ්‍යකාලීන සැලැස්ම (2012-2016) අදාළ සියලු ආයතනයන්හි සහභාගීත්වයෙන් සකස් කිරීමේ කාර්යය නිම කරන ලදී. මෙම මධ්‍ය කාලීන සැලැස්ම පහත සඳහන් තේමා 3 යටතේ සකස් කර ඇත.

තේමාව 1 ඃ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා සම සාධාරණ ප්‍රවේශ අවස්ථා වැඩිකිරීම

තේමාව 2 ඃ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම

තේමාව 3 ඃ යහපාලනය සහ අධ්‍යාපන සේවා සැපයීම ශක්තිමත් කිරීම

පදනම ඃ අධ්‍යාපන ආංශික සංවර්ධන පෙරලුම් සැලැස්ම

ප්‍රතිඵල පාදක නියාමනය සහ ඇගයීම ක්‍රියාත්මක කිරීම හරස්කඩ ක්‍රියාවලියකි.

ආංශික සංවර්ධන සැලැස්ම මහින්ද චින්තන ජාතික ප්‍රතිපත්තීන් ට අනුගත වන අයුරින් සකස් කර ඇති අතර, අන්තර් ජාතික වශයෙන් සහශ්‍ර සංවර්ධන අරමුණු, සැමට අධ්‍යාපන අරමුණු හා කලාපීය වශයෙන් සාක් සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමෙහිලා දායකත්වය සපයයි. පහතින් දැක්වෙනුයේ අධ්‍යාපන ප්‍රවේශය, ගුණාත්මක බව, ඵලදායි ව හා කාර්යක්ෂම ව මැනෙන දර්ශක කිහිපයකි.

## 7.2 ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය

**වගුව 7.2.1 : වයස අවු. 5-11 ශිෂ්‍යයන්ට නිවසේ සිට පාසලට ඇති දුර**

| | පාසලට ඇති දුර | | | | |
|---|---|---|---|---|---|
| දුර | කි.මී. 1 ට අඩු | කි.මී. 1 - 3 | කි.මී. 3 - 5 | කි.මී. 5 - 10 | කි.මී. 10 ට වැඩි |
| ශිෂ්‍ය ප්‍රතිශතය | 40.6 | 34.1 | 10.9 | 8.2 | 6.1 |

*Source: Child Activity Survey, 2008/09*

මෙම වගුව පෙන්වනුයේ ප්‍රාථමික වයස් සීමාවේ දරුවන්ගෙන් සියයට 74.7 කට නිවසේ සිට කිලෝමීටර 3 ක් ඇතුළත පාසලක් ඇති බව යි. සියයට 85.6 ක් වූ දරුවන්ට නිවසේ සිට කිලෝමීටර් 5 ක් ඇතුළත හෝ පිහිටි පාසලකට යාමට අවස්ථා හිමි ව ඇත.


## 7.3 අධ්‍යාපනයෙහි ශිෂ්‍ය සහභාගීත්වය

**වගුව 7.3.1 : ප්‍රාථමික අධ්‍යාපනය සඳහා දළ සහ ශුද්ධ ලේඛනගත අනුපාතය**

| | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| දළ ලේඛනගත අනුපාතය | 101 | 102 | 102 |
| ශුද්ධ ලේඛනගත අනුපාතය | 99 | 99 | 99 |

*Source: Household Income and Expenditure Survey 2006/07*

**ප්‍රස්ථාරය 7.3.1 : ප්‍රාථමික අධ්‍යාපනයේ ශුද්ධ ලේඛනගත අනුපාතය 1996-2006**




## 7.4 ප්‍රාථමික අධ්‍යාපන චක්‍රය සම්පූර්ණ කිරීම

**වගුව 7.4.1: ශිෂ්‍ය රැඳීසිටීමේ අනුපාතය - 2008**

| | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| 5 ශ්‍රේණිය දක්වා රැඳීසිටීමේ අනුපාතය | 99 | 100 | 99 |
| 9 ශ්‍රේණිය දක්වා රැඳීසිටීමේ අනුපාතය | 89 | 93 | 91 |

***Source: Annual School Census 2008(Transforming School Education in Sri Lanka, 2011)***

2011 දී දළ වශයෙන් පිරිමි ළමුන් සියයට 99 ක් ද ගැහැණු ළමුන් සියයට 100ක් ද ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කරන ලදී. කෙසේ වුව ද. 9 වන ශ්‍රේණියට යාමට පෙර සියයට 9 ක් පමණ වු ශිෂ්‍ය පිරිසක් පාසලෙන් ගිලිහෙන බව පෙනේ.

## 7.5 ගුරුවරුන්ගේ තත්ත්වය

පාසල් පද්ධතියේ සිටින වඩාත් වැදගත් ම මානව සම්පත වනුයේ විශාල සංඛ්‍යාවක් වන ගුරුවරුන්ය . අපගේ ගුරුවරුන් අතරින් වැඩි පිරිසක් අධ්‍යාපන විද්‍යාපීඨ පුහුණුව ලත් හෝ උපාධිධාරී ගුරුවරු වෙති. එසේ වුව ද අනාගත ලෝකයට ගැළපෙන අධ්‍යාපනයක් ලබාදීම සාර්ථක ව ඉටුකිරීම සඳහා ගුරුවරුන්ගේ දැනුම හා කුසලතා තවත් වැඩිදියුණු කිරීම සඳහා ගුරු අධ්‍යාපනය දියුණු කළ යුතු බව අධ්‍යාපන අමාත්‍යාංශය හඳුනාගෙන ඇත. පසුගිය දශක කීපයය තුළ පාසල් විෂයමාලාව වෙනස් වී ඇති අතර, සියලු ම විෂයන්හි තොරතුරු සමුදාය ඒ අනුව වැඩි වී ඇත. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව ගුරු පුහුණු හා ගුරු අධ්‍යාපන විෂයමාලාව වෙනස් කිරීමට පියවර ගනිමින් සිටී.

වගුව 7.5.1 : ගුරුවරුන් ලත් උසස්ම අධ්‍යාපන සුදුසුකම අනුව ප්‍රතිශතය -2010

| දිස්ත්‍රික්කය | අ.පො.ස (සා.පෙළ) | අ.පො.ස (උසස්.පෙළ) | ශාස්ත්‍ර වේදී/විද්‍යාවේදී/ අධ්‍යාපනවේදී උපාධි | ශාස්ත්‍ර පති/විද්‍යාපති/ අධ්‍යාපනපති/දර්ශ කපති උපාධි |
|---|---|---|---|---|
| කොළඹ | 7.7 | 39.9 | 49.7 | 2.6 |
| ගම්පහ | 8.4 | 44.5 | 44.8 | 2.3 |
| කළුතර | 8.4 | 46.1 | 43.6 | 1.9 |
| මහනුවර | 6.6 | 52.2 | 39.0 | 2.2 |
| මාතලේ | 7.7 | 52.0 | 38.7 | 1.6 |
| නුවරඑළිය | 7.7 | 64.3 | 27.0 | 1.0 |
| ගාල්ල | 6.9 | 51.1 | 40.7 | 1.3 |
| මාතර | 10.3 | 45.8 | 43.2 | 0.8 |
| හම්බන්තොට | 4.9 | 49.0 | 45.4 | 0.7 |
| යාපනය | 2.7 | 50.8 | 43.0 | 3.5 |
| කිලිනොච්චිය | 1.9 | 65.3 | 32.1 | 0.7 |
| මන්නාරම | 0.9 | 66.7 | 30.3 | 2.1 |
| වව්නියාව | 3.5 | 64.8 | 30.4 | 1.3 |
| මුලතිව් | 1.9 | 65.8 | 31.2 | 1.0 |
| මඩකලපුව | 5.3 | 51.7 | 41.8 | 1.2 |
| අම්පාර | 5.9 | 61.9 | 31.5 | 0.7 |
| ත්‍රිකුණාමලය | 6.3 | 66.8 | 25.4 | 1.4 |
| කුරුණෑගල | 6.1 | 50.0 | 42.3 | 1.6 |
| පුත්තලම | 4.9 | 59.8 | 34.0 | 1.2 |
| අනුරාධපුර | 9.0 | 54.9 | 35.2 | 0.9 |
| පොලොන්නරුව | 6.3 | 54.2 | 38.5 | 1.0 |
| බදුල්ල | 9.6 | 54.1 | 35.4 | 1.0 |
| මොණරාගල | 5.2 | 53.9 | 40.2 | 0.8 |
| රත්නපුර | 6.0 | 53.1 | 39.6 | 1.3 |
| කෑගල්ල | 8.3 | 51.2 | 39.0 | 1.6 |
| ශ්‍රී ලංකාව | 6.9 | 51.9 | 39.6 | 1.5 |

## 7.6 ඉගෙනුම් ඵලවල තත්ත්වය

ශිෂ්‍ය ඉගෙනුම් ඵල අධ්‍යාපනයේ උසස්භාවය මැනෙන ප්‍රධාන දර්ශකයක් වන අතර එය ආයතනික සංවර්ධනය සඳහා මග පෙන්වන ක්‍රමෝපායක් ලෙස භාවිතා කළ හැක. 7.6.1 හා 7.6.2 වගු පෙන්වනුයේ මෑත වර්ෂවල ප්‍රාථමික අධ්‍යාපනයේ ඉගෙනුම් ඵල ක්‍රමයෙන් දියුණු වී ඇති බවයි. 7.6.3 වගුවට අනුව කණිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ඉගෙනුම් ඵල වර්ධනය වී ඇත. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ ගොස් ඇති නමුත් ගණිතය, ඉංග්‍රීසි හා විද්‍යාව වැනි විෂයයන්හි සාධනය තවත් වැඩි කළ යුතු ව ඇත. වර්තමානයේ අ.පො.ස. (උසස් පෙළ) ශිෂ්‍යයන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් හදාරනුයේ සහ උසස් අධ්‍යාපයට තෝරාගනුයේ කලා විෂය ධාරාවයි. මෙම තත්ත්වය වෙනස් කර වැඩි ශිෂ්‍ය ප්‍රමාණයක් විද්‍යා හා වාණිජ විෂයයන් කරා යොමු කරවීම අත්‍යාවශ්‍ය ව පවතී.

මහින්ද චින්තන සංවර්ධන ප්‍රවේශය හරහා ශ්‍රී ලංකාව ආසියාවේ දැනුම් කේන්ද්‍රය ලෙස සංවර්ධනය කිරීමට නම් පාසල් අධ්‍යාපනයේ නව මංපෙත් විවර කිරීමේ අවශ්‍යතාව සංඛ්‍යාලේඛන හෙළි කරයි. මේ අනුව අධ්‍යාපන, උසස් අධ්‍යාපන, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන හා තාක්ෂණ, පර්යේෂණ හා ක්‍රීඩා අමාත්‍යාංශය එක් ව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හරහා උසස් අධ්‍යාපනයට හා විධිමත් වෘත්තීය අධ්‍යාපනයකට සිසුන් යොමු කිරීමට අපේක්ෂා කෙරේ.

**වගුව 7.6.1: පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හා අ.පො.ස. (උසස් පෙළ) විභාගවලදී ශිෂ්‍ය සාධනය 2007 – 2011**

| වර්ෂය | 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දී 70 ට වැඩි ලකුණු ප්‍රතිශතය | අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් ලද ප්‍රතිශය | අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලත් ප්‍රතිශතය |
|---|---|---|---|
| **2007** | 58.83 | 51.47 | 61.41 |
| **2008** | 39.45 | 56.80 | 62.89 |
| **2009** | 57.63 | 52.51 | 61.21 |
| **2010** | 56.19 | 60.57 | 61.67 |
| **2011** | 64.90 | 60.80 | - |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**වගුව 7.6.2 : ප්‍රාථමික අංශයේ 4 වන ශ්‍රේණියේ ශිෂ්‍යයන් ඉගෙනුම් ඵල පිළිබඳ ජාතික ඇගයීමේ දී දැක්වූ සාධනය 2003-2009**

| | **2003** | | **2009** | |
|---|---|---|---|---|
| | *ලකුණු 0 - 50 ත් අතර ලබාගත් ප්‍රතිශතය* | *ලකුණු 51 - 100 ත් අතර ලබාගත් ප්‍රතිශතය* | *ලකුණු 0 - 50 ත් අතර ලබාගත් ප්‍රතිශතය* | *ලකුණු 51 - 100 ත් අතර ලබාගත් ප්‍රතිශතය* |
| **ගණිතය** | 35 | 65 | 21 | 79 |
| **ඉංග්‍රීසි** | 69 | 31 | 44 | 56 |
| **පළමු බස** | 33 | 67 | 20 | 80 |


*Source: National Assessment of Learning Outcomes at Grade 4, NEREC*

**වගුව 7.6.3 : කනිෂ්ඨ ද්විතීයික අංශයේ 8 වන ශ්‍රේණියේ ශිෂ්‍යයන් ඉගෙනුම් ඵල පිළිබඳ ජාතික ඇගයීමේ දී දැක්වූ සාධනය 2005-2009**

| | **2005** | | **2008** | |
|---|---|---|---|---|
| | *ලකුණු 0 - 50 ත් අතර ලබාගත් ප්‍රතිශතය* | *ලකුණු 51 - 100 ත් අතර ලබාගත් ප්‍රතිශතය* | *ලකුණු 0 - 50 ත් අතර ලබාගත් ප්‍රතිශතය* | *ලකුණු 51 - 100 ත් අතර ලබාගත් ප්‍රතිශතය* |
| ගණිතය | **67** | **33** | **55** | **45** |
| විද්‍යාව | **47** | **53** | **41** | **59** |

***Source: National Assessment of Learning Outcomes at Grade 4, NEREC***

**ප්‍රස්ථාරය 7.6.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හර විෂයයන හි ශිෂ්‍ය සාධනය 2008 – 2011**




මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**වගුව 7.6.4: අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ශිෂ්‍ය සාධනය විෂයය සහ මාධ්‍ය අනුව - 2010**

| ධාරාව | සිංහල මාධ්‍ය | | දෙමළ මාධ්‍ය | | ඉංග්‍රීසි මාධ්‍ය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | *පෙනී සිටි* | *විශ්ව විද්‍යාල සුදුසුකම් ලැබූ* | *පෙනී සිටි* | *විශ්ව විද්‍යාල සුදුසුකම් ලැබූ* | *පෙනී සිටි* | *විශ්ව විද්‍යාල සුදුසුකම් ලැබූ* | *පෙනී සිටි* | *විශ්ව විද්‍යාල සුදුසුකම් ලැබූ* |
| ජීව විද්‍යාව | 15,647 | 37.10 | 2,599 | 46.40 | 570 | 52.30 | 18,816 | 38.84 |
| භෞතික විද්‍යාව | 12,421 | 34.90 | 1,945 | 41.40 | 572 | 49.50 | 14,938 | 36.28 |
| වානිජ | 32,315 | 58.10 | 5,493 | 59.10 | 707 | 72.30 | 38,515 | 58.49 |
| කලා | 52,922 | 63.10 | 16,170 | 68.60 | 149 | 67.80 | 69,241 | 64.37 |
| එකතුව | 113,305 | 55.00 | 26,207 | 62.40 | 1,998 | 59.70 | 141,510 | 56.41 |

***Source:** Department of Examinations, Sri Lanka*



ක්‍රීඩා කුසලතා නැංවීම සඳහා ක්‍රීඩා කඳවුරු පැවැත්වීම



ගුරුවරුන්ගේ තොරතුරු තාක්ෂණ කුසලතා වර්ධනය කිරීම



අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය උදෙසා ගුරු සංවර්ධනය

# පරිච්ඡේදය 8 :
# අධ්‍යාපන සංවර්ධන කාර්යයන්හි ප්‍රගත

## 8.1 ප්‍රාථමික අධ්‍යාපනය

ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීමේ අරමුණින් සියලු ම ප්‍රාථමික පාසල් “ළමා මිතුරු පාසල්” ප්‍රවේශය මත පදනම් ව සංවර්ධනය කිරීමට යුනිසෙෆ් ආයතනය හා එක් ව අධ්‍යාපන අමාත්‍යාංශය පියවරගෙන ඇත. සියලු ම ශිෂ්‍යයින් ප්‍රාථමික අධ්‍යාපන අවධියේ අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතාවලට ළඟාවීම තහවුරු කරනු වස්. ළමා මිතුරු පාසල් ප්‍රවේශය පාසල් සංවර්ධනය මෙන් ම ළමා සංවර්ධනය ද අරමුණු කොට ක්‍රියාත්මක කෙරේ.

- 2011 වර්ෂයේ දී ජාතික පාසල් 206 ක ප්‍රාථමික අංශ සඳහා ගුණාත්මක යෙදවුම් සපයන ලදී.
- ජාතික පාසල් 251කට ප්‍රාථමික විද්‍යා ගීත උපකරණ සපයන ලදී.
- සෑම පළාතක ම ගණිත සංවර්ධන සහ ක්‍රියාකාරකම් පාදක ඉංග්‍රීසි ශිෂ්‍ය කඳවුරු පවත්වන ලදී.
- ජාතික පාසල් 5ක ප්‍රාථමික අංශ සඳහා ලීබඩු හා පරිගණක යන්ත්‍ර ලබාදෙන ලදී.
- ශිෂ්‍ය සාධනය දියුණු කිරීමේ අරමුණින් 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ පිළිතුරු විශ්ලේෂණය පිළිබඳ ව පළාත් සම්පත් කණ්ඩායම් දැනුවත් කරන ලදී.
- පාසල් 14ක පළමුවන ශ්‍රේණිය සඳහා නියාමන මට්ටමින් බහුතල ඉගෙනුම් ක්‍රමවේද හඳුන්වා දෙන ලදී.
- නව ආදර්ශ ප්‍රාථමික පාසල් ව්‍යාපෘතිය යටතේ විදුහල්පතිවරුන් 303ක් පුහුණු කරන ලද අතර, ගුරුවරුන් සඳහා පරිගණක පුහුණු, ඉංග්‍රීසි භාෂා සහ ආකල්ප වර්ධන වැඩසටහන් පවත්වන ලදී.

## 8.2 ආගමික සහ සාරධර්ම අධ්‍යාපනය.

ආගමික ඉගැන්වීම් අනුව තම ජීවිත හැඩගස්වා ගැනීම තුළින් සාරධර්ම සුරකින යහපත් පුරවැසියන් පරපුරක් බිහිකිරීම අරමුණු කරගත් අධ්‍යාපන වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක වේ.

- 2011 වර්ෂයේ දී විශේෂයෙන් 2600 වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සැමරීම සඳහා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.
- බෞද්ධ දරුවන් වැඩි ප්‍රමාණයක් ඉගෙන ගන්නා පාසල්වල ශීල සමාදන වැඩසටහන් පැවැත්වීම
- 2600 ශ්‍රී සම්බුද්ධ ජයන්ති ශාස්ත්‍රීය සංග්‍රහය එළි දැක්වීම
- දිවයිනේ සෑම ප්‍රදේශයකින් ම පැමිණි ශිෂ්‍ය ශිෂ්‍යාවන් දහස් ගණනකගේ සහභාගීත්වයෙන් “ඇසල මහා සිසු පෙරහර” 2011 ජූලි 14 වන දින කොළඹ දී පැවැත්වීම.
- 2011 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමී ව බුත්තල, මොණරාගල, වැල්ලවාය හා බිබිල යන කලාපවල ශිෂ්‍යයන්ගේ හා ගුරුවරුන් සඳහා සාරධර්ම ඔපවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී
- කොළඹ ආනන්ද බාලිකා විද්‍යාලයීය පරිශ්‍රයේ දී අනගාරික ධර්මපාලතුමාගේ ප්‍රතිමාවක් නිරාවරණය කරන ලද අතර, එතුමා වෙනුවෙන් කෞතුකාගාරයක් විවෘත කරන ලදී
- අග්‍රාමාත්‍ය කාර්යාලයයේ ද සහයෝගයෙන් “සිරිත් මල්දම” රූප කාව්‍යයක් ලෙසින් අඩංගු සීඩී තැටිය පාසල් අතර නොමිලේ බෙදදෙන ලදී
- බුද්ධාගම විෂයයේ සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා මධ්‍යම, ඌව, දකුණ හා සබරගමුව පළාත්වල වැඩසටහන් සංවිධානය කරන ලදී.
- කතෝලික, ක්‍රිස්ත්‍රියානි හා මුස්ලිම් පාසල්වල විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ ශිෂ්‍යයන් අතර සාරධර්ම නැංවීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

## 8.3 පිරිවෙන් අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ පාසල් සඳහා ලබාදෙන සියලු පහසුකම් පිරිවෙන්වලටත් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර ඇත. ඒ අනුව පරිගණක අධ්‍යාපනය, ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනයට අවශ්‍ය සියලු පහසුකම් පිරිවෙන්වලටත් ලබාදෙනු ඇත.

- කාලීන අවශ්‍යතා අනුව 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී.
- අවශ්‍යතා අනුව හඳුනාගත් පිරිවෙන් 12 ක් ඒ ඒ ප්‍රදේශයන්හි ස්ථාපිත කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලදී.
- පිරිවෙන් 45ක ත්‍රි භාෂා අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කෙරිණි
- නේපාලයේ සහ ඉන්දියාවේ පිහිටුවන ලද පිරිවෙන් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට ක්‍රියා කරන ලදී.
- පිරිවේන් පුස්තකාල සඳහා ත්‍රිපිටක ග්‍රන්ථ බෙදහැරීම නිම කරන ලදී.
- අන්තර පිරිවෙන් භාෂා හා සාහිත්‍ය තරග පවත්වන ලදී.

## 8.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන

අධ්‍යාපනයේ අභිමතාර්ථ කරා ළගාවීම සඳහා වර්තමානයේ තොරතුරු තාක්ෂණය වැදගත් මෙවලමක් ලෙස ක්‍රියා කරයි. වර්තමාන පාසල් ශිෂ්‍යයා අනාගතයේ කිසියම් ක්ෂේත්‍රයක වෘත්තියෙකු බවට පත් කිරීමට තොරතුරු තාක්ෂණය මහගු මෙහෙයක් ඉටු කරයි.

- 2011 දී පාසල් 127 ක පරිගණක විද්‍යාගාර සඳහා පරිගණක ලබාදීමට පියවර ගන්නා ලදී.
- කතරගම මධ්‍ය මහා විද්‍යාලයයේ පරිගණක විද්‍යාගාර ඉදිකිරීම නිම කරන ලද අතර, කතරගම සහ නක්කාවත්ත මධ්‍ය මහා විද්‍යාලයන්හි පරිගණක විද්‍යාගාර සඳහා පරිගණක යන්ත්‍ර සපයන ලදී.
- වවුනියා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ නේවාසිකාගාරය ඉදි ,කිරීම අවසන් කරන ලදී.
- අ.පො.ස (සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස (උසස් පෙළ) තොරතුරු තාක්ෂණ විෂයය දියුණු කිරීම සඳහා ශිෂ්‍ය සම්මන්ත්‍රණ සහ ගුරු ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- "සෑම ශිෂ්‍යයකුට ලැප්ටොප් පරිගණකයක් " ව්‍යාපෘතියට සමගාමීව 1-5 ශ්‍රේණි සඳහා විෂයානුබද්ධ මෘදුකාංග සකස් කරන ලදී.
- දෘඩාංග සහ ජාල විසදුම් කණ්ඩායම් මගින් පාසල්වල පරිගණක විද්‍යාගාර ආශ්‍රිත දෘඩාංග හා ජාලගත ගැටළු විසදීමට පියවර ගනු ලැබිණි.
- තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය ඉහළ නැංවීමේ ලා ජාතික තරගාවලියක් පවත්වන ලදී.

*ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තරගාවලිය*

ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ කර්මාන්තකරුවන්ගේ සංසදය හා ශ්‍රී ලංකා පරිගණක සංගමය හා ඒකාබද්ධ ව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම තරගාවලිය පවත්වන ලදී.

ජයග්‍රාහි ශිෂ්‍යයන් හා ගුරුවරුන්ට සම්මාන ප්‍රදානය ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයේ දී සිදු කරන ලදී. සියලු පළාත් නියෝජනය කළ දහසකටත් වඩා වැඩි සිසුන් පිරිසක් ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ නිර්මාණ පළාත් හා ජාතික මට්ටමේ දී ප්‍රදර්ශනය කරන ලදී. ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් 6 දෙනෙක්, පළාත් මට්ටමේ ජයග්‍රාහකයින් 27 දෙනෙක් හා සහතිකලාභීන් 100 ක් සංකේත පදක්කම් හා සහතික දිනා ගත්හ.

**වගුව 8.1: අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයන්හි ශිෂ්‍ය සාධනය -2008-2011**

| | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|
| විෂය සඳහා ඉදිරිපත් වු සංඛ්‍යාව | 38759 | 40413 | 41490 | 39797 |
| සමත් ප්‍රතිශතය | 87.54 | 82.13 | 82.33 | 71.39 |


*මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව*

## 8.5 ගණිත අධ්‍යාපනය

අභියෝගවලට මුහුණදිය හැකි නිර්මාණශීලි තාර්කික සිසු පරපුරක් බිහි කිරීම අරමුණු කරගත් ගණිත අධ්‍යාපනය ඉහල නැංවීමේ වැඩසටහන් කිහිපයක් සාර්ථක ව ක්‍රියාත්මක කරන ලදී.

- 5 වන ශ්‍රේණියේ සිට 6 වන ශ්‍රේණියට පැමිණෙන ශිෂ්‍යයන් අතර ගණිත දැනුමෙහ ඇති ඌනතා මග හැරවීම සඳහා 6 වන ශ්‍රේණියේ තෝරාගත් ශිෂ්‍යයන් 10000 කට ප්‍රතිකාර්ය අධ්‍යාපන වැඩසටහනක් ක්‍රියාවට නංවන ලදී. මේ සඳහා අවශ්‍ය පැවරුම් පොත් 28000ක් මුද්‍රණය කර පළාත්වලට බෙදහරින ලදී.
- අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල ඉහල නැංවීම සඳහා 11 වන ශ්‍රේණියේ ශිෂ්‍යන් 20000 කට ප්‍රතිකාර්ය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. "ගණිතයට අත්වැලක් "පොතෙහි පිටපත් 10000 ක් වැඩසටහන ක්‍රියාත්මක කරන මධ්‍යස්ථාන වලට බෙදදෙන ලදී.
- ජ්‍යාමිතික කුසලතා ඔප් නැංවීම සඳහා ගණිත ගුරුවරුන් හා සම්පත් පුද්ගලයින් 1050කට පුහුණුවක් ලබා දෙන ලදී.
- ජයවර්ධනපුර, පිළියන්දල හා හොරණ අධ්‍යාපන කලාපවල ගණිත ඉගැන්වීම් ක්‍රම දියුණු කිරීමේ නියාමන වැඩසටහනක් පවත්වන ලදී.

**ප්‍රස්ථාරය 8.1: අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිත විෂයය සමත්වීමේ ප්‍රතිශතය -2011**





*මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව*

## 8.6 විද්‍යා අධ්‍යාපනය

විද්‍යාත්මක සාක්ෂරතාවක් සහිත පරපුරක් බිහිකිරීම සඳහා ගුණාත්මක විද්‍යා අධ්‍යාපනයක් පාසල් තුළින් ලබාදීම අත්‍යවශ්‍ය වේ. රටේ ඉදිරි සංවර්ධනය සඳහා නව දැනුම භාවිතා කරන විද්‍යාත්මක සාක්ෂරතාවක් සහිත ශ්‍රම බලකායක් බිහි කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ අරමුණයි.

- අ.පො.ස. (උසස් පෙළ) භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව විෂයයන්හි විෂය නිර්දේශවල නොගැළපෙන කොටස් හඳුනාගෙන ඒවා ඉවත් කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. 2012 වර්ෂයේ සිට සංශෝධිත විෂය නිර්දේශය ක්‍රියාවට නැංවේ.
- විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍ය පාසල් 400 ක් සඳහා මිල දී ගන්නා ලද අතර, මෙම ද්‍රව්‍ය මිලයට ගැනීමේ දී සැලකිය යුතු නිර්ණායක පිළිබඳ ලේඛනයක් ද පිළියෙල කරන ලදී.
- ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍ර අධ්‍යාපන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී.
- පර්යේෂණ හා තාක්ෂණ කටයුතු අමාත්‍යංශ හා එක් ව දුෂ්කර ප්‍රදේශවල ශිෂ්‍යයන්ට කොළඹ වැදගත් ස්ථාන නැරඹීම සඳහා චාරිකා සංවිධානය කරන ලදී.
- ජංගම විද්‍යාගාර භාවිතය පිළිබඳ ව වාර්තාවක් සකස්කර අනාගත ජංගම විද්‍යාගාර සැපයීමේ ක්‍රමවේදය හඳුනා ගන්නා ලදී.
- පාසල්වල බලශක්ති සංරක්ෂණ සමාජ පිහිටුවීමට පියවර ගැණිනි.
- ගුරුවරුන් සඳහා නැනෝ තාක්ෂණය පිළිබඳ වැඩමුළු පවත්වන ලදී.

**ප්‍රස්ථාරය 8.2: අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විද්‍යාව විෂයය සමත්වීමේ ප්‍රතිශතය -2011**




*මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව*

## 8.7 ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය

ශ්‍රී ලාංකික අනන්‍යතාව සුරකින සංස්කෘතියට හා ජාතික භාෂාවන්ට ගරු කරන අනාගත පරපුරක් බිහි කිරීම අරමුණ අප සැබැවින් ම ළඟා කරගත යුතු ය. ඉදිරි පරපුර වෙත සංස්කෘතිය පවරාදීමට ඉවහල්වන භාෂා කුසලතා සහ සමාජයීය දැනුම ඔප්නැංවීම සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදී.

- 6 - 13 ශ්‍රේණිවල සිසුන්ගේ චතුර්විධ භාෂා කුසලතා නැංවීමේ අරමුණින් සිංහල, දෙමළ හා දෙවන භාෂාව යන අංශ තුනෙන් ම භාෂා හා සාහිත්‍ය තරග පවත්වන ලදී.

- ළමා ලේඛකයන් ගේ දක්ෂතා නැංවීමට 'නුවන' සහ 'කුර්මති' සඟරා මුද්‍රණය කර බෙදාහැරීමට පියවර ගනු ලැබිණි.

## 8.8 ඉංග්‍රීසි සහ විදේශභාෂා අධ්‍යාපනය


අධ්‍යාපන අමාත්‍යාංශයේ අරමුණ වනුයේ ඉංග්‍රීසි භාෂාවෙන් හොඳින් කියවිය හැකි, පැහැදිළි ව ලිවිය හැකි චතුර ලෙස කථා කළ හැකි, ශිෂ්‍ය පරපුරක් බිහිකිරීම හා ශිෂ්‍යයන් ඉංග්‍රීසි බසින් ලියවුන අති විශාල ඉගෙනුම් ද්‍රව්‍ය සමූහයක ඵල ප්‍ර යෝජන ගත හැකි පරිදි භාෂා කුසලතා පිරි පරපුරක් බවට පත් කිරීමයි. එමෙන් ම ලෝකයේ ප්‍රචලිත භාෂාවක් ප්‍රගුණ කරවීමට ශිෂ්‍යයන් යොමු කරවීමයි.

- ඉංග්‍රීසි භාවිතය හුරු කිරීම පිණිස 2011 දී ශිෂ්‍යයන් 1152 ක ගේ සහභාගීත්වයෙන් තරග, ප්‍රදර්ශන, කඳවුරු හා උත්සව පවත්වන ලදී.

- කලාපීය ඉංග්‍රීසි අධ්‍යාපන මධ්‍යස්ථානවල දී ඉංග්‍රීසි ගුරුවරුන් 800ක් සඳහා පුහුණු පාඨමාලා පවත්වන ලදී.
- 100,000 පමණ ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා සැමට ඉංග්‍රීසි වැඩසටහන ක්‍රියාවට නංවනු ලැබිනි.

- ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා විශිෂ්ඨ මධ්‍යස්ථාන 3 ක් ස්ථාපිත කරන ලදී.

**ප්‍රස්තාරය 8.3: අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදි ඉංග්‍රීසි සමත්වීමේ ප්‍රතිශතය - 2011**




*මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව*

***ජීවන කුසලතාවක් ලෙස ඉංග්‍රීසි***

දරුවන් බියකින් හා චකිතයකින් තොරව ඉංග්‍රීසි කතා කිරීමට දිරිමත් කරනු වස් ජනාධිපති ලේකම් කාර්යාලයයේ ද සහාය ඇති ව ක්‍රියාත්මක වන වැඩසටහනකි. දරුවන්ගේ අනාගත ජීවන තත්ත්වය උසස් කිරීම එහි අපේක්ෂාවයි. පළාත් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් අතරින් පහත සඳහන් වැඩසටහන් ප්‍රධාන වේ.

- දස දින ගුරු පුහුණු වැඩසටහන
- පළාත් වැඩසටහන් ඒකක පිහිටුවීම
- සංයුක්ත තැටි එකතුවක් නිකුත් කිරීම
- එළදයි ක්‍රියාකාරකම් සහිත ඉගැන්වීම් කට්ටලයක් නිර්මාණය
- විදුහල්පතිවරුන් සහ නියෝජ්‍ය විදුහල්පතිවරුන් සඳහා පැය 100 ක ඉංග්‍රීසි සහතික පත්‍ර
- පාඨමාලාවක් ක්‍රියාත්මක කිරීම
- අධ්‍යාපන කොට්ඨාසවල ඉංග්‍රීසි ක්‍රියාකාරකම් කාමර බලවන්ත කිරීම
- විභාග ඇගයීම් උපදේශන සංග්‍රහය නැවත මුද්‍රණය

## 8.9 ද්විභාෂා අධ්‍යාපනය

භාෂා විවිධත්වය තුළින් දැනුම් ලොව නිම් වළලු පුළුල් කිරීම යන දර්ශනය මත පදනම් ව අනාගත පරපුර බහු භාෂීය කුසලතා තුළින් සවිමත් කිරීම සඳහා ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

- මේ යටතේ ද්විතීයික ශ්‍රේණිවල ශිෂ්‍යයන්ට විෂයයන් කිහිපයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගැනීමට අවස්ථා සපයනු ලැබේ.
- ද්විභාෂා අධ්‍යාපන අවස්ථා සහිත පාසල් සංඛ්‍යාව පාසල් 1000 දක්වා ව්‍යාප්ත කරන ලදී.
- ගුරු මධ්‍යස්ථාන 57 ක දී සිංහල හා දෙමළ ගුරුවරුන්ට ඉංග්‍රීසි බසින් ඉගැන්වීම් පිළිබඳ පුහුණුවක් ලබා දෙන ලදී.
- ගුරු මධ්‍යස්ථාන 57 ක කළමනාකරුවන් ද්විභාෂා ගුරුවරුන් 64 ක් සහ විදුහල්පතිවරුන් 50 ක් මෙම වැඩස-ටහන පිළිබඳ ව පුහුණු කරන ලදී.
- ඉංග්‍රීසි මාධ්‍ය උපාධිධාරී නවක ගුරුවරුන් 130කට ආරම්භක පුහුණුවක් ලබාදෙන ලදී
- ද්විභාෂා සිසුන්ට ඇගයීම් ක්‍රියාවලියේ දී කෙතරම් බලපෑමක් ඇත් ද යන්න විශ්ලේෂණ කිරීමට පියවර ගැණිනි.
- 2012 දි ක්‍රියාත්මක කිරීමට නියමිත අන්තර්ගතය හා භාෂාව සමෝධානික ඉගෙනුම් රාමුව සකස් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිණි.

## 8.10 කෘෂිකර්ම හා පරිසර අධ්‍යාපනය

ශිෂ්‍යයන්ගේ කෘෂිකාර්මික දැනුම මෙන් ම කෘෂි කර්මාන්තය සහ ස්වභාවික පරිසර සම්පත් සුරැකීම සඳහා අවශ්‍ය නිපුණතා සහ ආකල්ප දියුණුකිරීම කේන්ද්‍ර කොටගත් විෂය සමගාමී හා විෂයානුබද්ධ ක්‍රියාකාරකම්වලට සහභාගීවීමට මෙම වැඩසටහන අවස්ථාව සලසයි.

- පාසල් ගොවිපොල 32 ක් පිහිටුවීම සඳහා ගුරුවරුන් 110 ක් පුහුණු කිරීමට කටයුතු කරන ලදී.
- පවතින පාසල් ගොවිපොල 10 ක් නඩත්තු කිරීම සඳහා පාසල්වලට මූල්‍යාධාර ලබාදෙන ලදී
- හරිත පාසල් වැඩසටහන පිළිබඳ ව පළාත් හා කලාප අධ්‍යාපන නිලධාරීන් 20 ක් ද, බස්නාහිර නිලධාරීන් 25 ක් ද දැනුවත් කරන ලදී.
- හරිත පාසල් වැඩසටහන පිළිබඳ ව උපදෙස් සංග්‍රහයක් පිළියෙල කරන ලදී.
- ශිෂ්‍යයන් 100කගේ සහභාගීත්වයෙන් පරිසර කඳවුරක් බස්නාහිර පළාතේ පවත්වන ලදී.
- ග්ලෝබ් වැඩසටහන යටතේ ජල සහ ආවරණ අධ්‍යයන කඳවුරක් ශිෂ්‍යයන් 60කගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- පාංශු සහ භූ ආවරණ අධ්‍යාපන කඳවුරු ගුරුවරුන් හා නිලධාරීන් 60 දෙනෙකු සඳහා පවත්වන ලදී.
- ධීවර සහ ආහාර තාක්ෂණය, භූමි අලංකරණය සහ පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ව කෘෂිකර්ම නිලධාරීන් 52 ක් සඳහා වැඩසටහනක් පවත්න ලදී.
- ජාතික පාසල් 100 ක් සඳහා කෘෂිකර්ම උපකරණ පාසල් 05 ක් සඳහා ග්ලෝබ් උපකරණ ද සපයන ලදී.

*"අද වවමු පැලයක් හෙට නෙලමු එලයක් " වැඩසටහන යටතේ සිංහල හා දෙමළ අලුත් අවුරුදු උලෙළට සමගාමී ව පැල ලක්ෂ 50 ක් සිටුවීමේ වැඩ පිළිවෙලක් කෘෂිකර්ම, පොල් සංවර්ධන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශවල හා අදාළ ආයතනවල සහයෝගයෙන් පාසල්වල දියත් කරන ලදී.*

## 8.11 සෞන්දර්ය අධ්‍යාපනය

මානව හිතවාදී අනාගත පරපුරක් බිහිකිරීමේ අරමුණ පෙරදැරි ව සෞන්දර්ය අධ්‍යාපන වැඩසටහන් විෂයයක් ලෙස හා විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස ක්‍රියාත්මක වේ.

- 'ශනි දින' බහු ශිල්ප - චිත්‍ර, නැටුම්, සංගීත හා නාට්‍ය පාඨමාලා සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 12770 ක් 2011 වර්ෂයේ දී සහභාගී වූහ.
- නැටුම්, පෙරදිග සංගීතය, බටහිර සංගීතය නාට්‍ය හා රංග කලාව සඳහා සමස්ත ලංකා පාසල් සෞන්දර්ය තරගාවලිය ශිෂ්‍ය ශිෂ්‍යාවන් 60000 කගේ සහභාගීත්වයෙන් ද, චිත්‍ර තරගය සියලු ම සිසුන්ගේ සහභාගීත්වයෙන් ද පවත්වන ලදී.
- 'සොඳුරු පුබුදුව' වැඩසටහන සඳහා ගුරුවරුන් 400ක් පුහුණු කරන ලදී.
- පාසල් සිසුන් 380 ට වෙස් බැඳීම සඳහා සම්ප්‍රදායික වෙස් මංගල්‍යය පවත්වන ලදී.
- ජාතික පාසල් 340 සඳහා සෞන්දර්ය උපකරණ මිලදී ගැනීමට පියවර ගන්නා ලදී.
- 'උතුරු මිතුරු' වැඩ සටහනේ දී සිංහල හා දෙමළ සිසුන්ට තම සෞන්දර්ය දක්ෂතා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ඉඩකඩ සලසා දෙන ලදී.

## 8.12 වාණිජ හා ව්‍යාපාර අධ්‍යයනය

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයනය විෂයය තුළින් අනාගත දියුණු වන ලෝකයට අවශ්‍ය කුසලතා පිරිපුන් පරපුරක් බිහි කිරීමට අපේක්ෂා කෙරේ

- වාණිජ අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරීන් 110 ක් ද, සේවාස්ථ ගුරු උපදේශකවරුන් 125 ක් ද, නව වැඩ සටහන් පිළිබඳ දැනුවත් කරන ලදී.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනස් කළ යුතු අංග හඳුනාගැනීමට පියවර ගැණිනි.
- නැඩමුළු තුළින් දැනට පවතින වාණිජ විෂය නිර්දේශයේ නොගැළපෙන කරුණු හඳුනාගැනීමට පියවර ගනු ලැබිණි.

## 8.13 ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය

දිරි ගැන්වීම, ශාරීරික යෝග්‍යතාව හා ප්‍රජානන කුසලතා වර්ධනය යහපත් හුරුපුරුදු සහ ක්‍රියාකාරී ජීවන රටාවකට හැඩගැස්වීම ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන වැඩසටහන්වල පරමාර්ථයයි.

- අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගාවලිය 2011 අගෝස්තු ඔක්තෝම්බර් කාලසීමාව තුල අදියර 3 කින් පවත්වන ලදී.
- මෙහි ලා විශේෂයෙන් සඳහන් කළයුතු කරුණක් වන්නේ ලංකා බැංකුවේ අනුග්‍රහයෙන් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මූල්‍ය ත්‍යාග පිරිනැමීමයි. ඒ අනුව සෑම ඉසව්වකින්ම තෝරා ගත් දක්ෂතම ක්‍රීඩකයාට සහ ක්‍රීඩිකාවට රු. 25000 බැගින් වන සේ ක්‍රීඩකයින් 40 කට මුදල් ත්‍යාග පිරිනමන ලදී.
- සමස්ත තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට සහ ක්‍රීඩිකාවට රු 125000 බැගින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව අනුග්‍රහයෙන් පිරිනමන ලදී.

*2011 ජාතික පාසල් ක්‍රීඩා උලෙළේ දී නව වාර්තා 24ක් තැබීමට ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත් වූහ.*

| | | | |
|---|---|---|---|
| *බස්නාහිර* | *09* | *දකුණ* | *01* |
| *සබරගමුව* | *05* | *වයඹ* | *02* |
| *මධ්‍යම* | *04* | *ඌව* | *01* |
| *උතුර* | *02* | | |

## 8.14 විෂය සමගාමී මාර්ගොපදේශ සහ උපදේශන වැඩසටහන්

විෂයමාලාව තුළින් හා විෂයානුබද්ධ හා විෂය සමගාමී ක්‍රියාකාරකම් තුළින් සමාජ සංහිදියාව ඇති කිරීමට සහ සමාජයීය කුසලතා වර්ධනය කිරීමට පාසල ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි.

- 2011 වර්ෂයේ දී සමස්ත ලංකා ටවර්හෝල් නාට්‍ය තරගය පාසල් 150 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1500ක ගේ පමණ සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- ගුරුවරුන් 1000 කගේ හා ශිෂයන් 2500 පමණ සහභාගීත්වයෙන් මත්ද්‍රව්‍ය නිවාරණ තරගාවලියක් පවත්වන ලදී.
- ගුරුවරුන් සහ ශිෂ්‍යයන් මත්ද්‍රව්‍ය භාවිතයේ අවදානම පිළිබඳ දැනුවත් කිරීම සඳහා මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය සහ පිළිකා වැළැක්වීමේ මධ්‍යස්ථානය සමග එක් ව පාසල් 200 ක් හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 17 ක් සඳහා වැඩමුළු 25 ක් පවත්වන ලදී.
- පාසල් 6000ක් සමග මනෝ සාමාජීය මැදිහත්වීමේ වැඩසටහන ක්‍රියාවට නැංවිනි.
- අධ්‍යාපන උපදේශක සේවාව පාසල් මට්ටමින් සෑම විදුහලක ම ක්‍රියාත්මක කෙරේ.
- පාසල් වෘත්තීය මාර්ගෝපදේශ සේවාව 1 AB හා 1C පාසල් 2700 ක ක්‍රියාත්මක වේ.
- සියලු ම ගුරු මධ්‍යස්ථාන සඳහා වෘත්තීය මාර්ගොපදේශ නිලධාරියකුගේ සේවාව ලබාදීම ආරම්භ කරන ලදී.
- "සෙනෙහසක තක්සලාව", "දෙනුවර මිතුරෝ" සහ "ශිෂ්‍ය පාර්ලිමේන්තුව" වැඩසටහන් ක්‍රියාත්මක කර එමගින් දරුවන් තුළ සාමය හා සමාජ සංහිදියාව වර්ධනය කිරීමට පියවර ගනු ලැබිණි.

## 8.15 පාසල් පුස්තකාල සංවර්ධනය

ප්‍රජා මිතුරු, විනයගරුක හා වගකීම් පිළිබඳ අවබෝධයෙන් යුත් දරු පරපුරක් බිහිකිරීම සඳහා අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා ළඟාකර ගැනීමට කියවීමේ පුරුද්ද සිසුන් තුළ දියුණු කළ යුතු බැවින්, පාසල් පුස්තකාල සංවර්ධනය කිරීමට පියවර රැසක් ගන්නා ලදී

- පාසල් පුස්තකාල ඵලදායි ලෙස භාවිතය පිළිබඳ ව විදුහල්පතිවරුන් , පුස්තකාලයාධිපතිවරුන් හා ගුරුවරුන් සඳහා වැඩමුළු 7 ක් පවත්වන ලදී.
- සියලු ම පළාත්වල ආදර්ශ කියවීම් කඳවුරු සහ කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- පුස්තකාල පොත් මිලදී ගැනීමට ජාතික පාසල් 341 කට මුදල් ප්‍රතිපාදන සපයනු ලැබිණි.
- ජාතික අධ්‍යාපන ආයතනය හා එක් ව රූපවාහිනී හා ගුවන්විදුලි අධ්‍යාපන වැඩසටහන් නිෂ්පාදනය කරන ලදී.
- ජාතික පාසල් 150ක් සඳහා පුස්තකාල ලී බඩු සැපයීම නිම කරන ලදී.
- පාසල් පුස්තකාල සඳහා උපදෙස් සංග්‍රහයක් පිළියෙල කරන ලදී.

## 8.16 අන්තර්කරණ අධ්‍යාපනය තුළින් "සැමට අධ්‍යාපන" අවස්ථා පුළුල් කිරීම

ශිෂ්‍යයන්ගේ ජාතිය, ආගම් හෝ භාෂා වෙනස්කමින් භූගෝලීය සාධක නොසලකා හැම ශිෂ්‍යයෙකුට ම සම අධ්‍යාපන අවස්ථා ලබාදීම රජයේ ප්‍රතිපත්තියයි. "සැමට අධ්‍යාපන" අරමුණු ළඟා කර ගැනීම තහවුරු කිරීම පිණිස අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශය පාසල්වලට වඩාත් බලවන්ත කිරීම සඳහා පියවර ගනු ලැබිණි.

- සොරණාතොට . කන්දකැටිය, මීගහකිවුල හා මන්නාරම යන අධ්‍යාපන කොට්ඨාසවල අන්තර්කරණ අධ්‍යාපන උපකරණ කට්ටල නියාමන මට්ටමින් ක්‍රියාවට නංවන ලදී.
- ප්‍රාථමික පළමු ප්‍රධාන අවධියේ ගුරුවරුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා පුහුණු කිරීමට මොඩියුලයක් හා විද්‍යුත් ඉගෙනුම් පැකේජයක් සකස් කරන ලදී.

## 8.17 ජාතික පාසල් සංවර්ධනය

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන පාසල් 340ක් ජාතික පාසල් ගණයට වැටේ.

- ජාතික පාසල් 338 ක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ගුණාත්මක ඉගෙනුම් මිල දී ගැනීමට රු.මි. 12.65 ක මුදලක් 2011 වර්ෂයේදී වෙන් කරනු ලැබිණි.
- ජාතික පාසල් 75 කට අවශ්‍ය ලීබඩු උපකරණ සපයනු ලැබිණි
- මූල්‍ය කළමනාකරණය පිළිබඳ ව විදුහල්පතිවරුන් පුහුණු කරන ලදී.

## 8.18 උතුරු පළාතේ අධ්‍යාපන සංවර්ධනය

උතුරු පළාතේ ගැටුම් වලින් අවතැන් වී අධ්‍යාපනයේ පසුබෑමකට ලක් වූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නැවත හොඳින් කරගෙන යාම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා අනෙකුත් පහසුකම් සැපයීමට උතුරු පළාත් සංවර්ධන ජනාධිපති කාර්යසාධන බලකාය හා උතුරු පළාත් අධ්‍යාපන බලධාරීන් ක්‍රියාවට නංවන ලදී.

- 2011 වර්ෂයේදී වැඩසටහන් පළාත් අධ්‍යාපන ව්‍යුහය හරහා ක්‍රියාවට නංවන ලදී.
- ඒ අතර අධ්‍යාපන අමාත්‍යාංශ්‍ය විසින් විදුහල්පතිවරුන් 26 ක් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් 13 ක් සඳහා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- පාසල් කළමනාකරණ සහකාරවරුන් 26 දෙනෙකු සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## 8.19 වතු පාසල් සංවර්ධනය

වතු පාසල්වල අධ්‍යාපන ප්‍රවේශය සහ ගුණාත්මක අධ්‍යාපන වැඩිකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය අදාළ අනෙකුත් අමාත්‍යාංශ හා එක් ව විවිධ පියවර අඛණ්ඩ ව ගනු ලැබේ. මේ වන විට සැලකිය යුතු ප්‍රගතියක් ළඟා කරගෙන ඇති නමුත්, තවදුරටත් පවතින අධ්‍යාපන සාධක මට්ටම්වල හා සම්පත්වල විෂමතා අඩුකිරීමට කටයුතු කරනු ලැබේ.

- මධ්‍යම, ඌව, බස්නාහිර හා දකුණු පළාත්වල වතු පාසල් හි ප්‍රාථමික අධ්‍යාපනය නැංවීමට ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- ඒ අතර ම මධ්‍යම, සබරගමුව, ඌව, බස්නාහිර හා දකුණු පළාත්වල වතු පාසල් ද්විතීයික ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය නැංවීමට ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- මධ්‍යම හා සබරගමුව පළාත්වල වතු ශිෂ්‍යයන් සඳහා මනෝසමාජීය උපදේශන හා සෞඛ්‍ය අධ්‍යාපන ලබාදීමට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## 8.20 මුස්ලිම් පාසල් සංවර්ධනය

මුස්ලිම් ජාතික අනන්‍යතාව, සංස්කෘතික හා ආගමික අගයන් සුරකිමින් නිපුණතා සංවර්ධනය කර ගැනීම තුළින් සමස්ත අධ්‍යාපන අරමුණු ළඟා කර ගැනීම සඳහා මුස්ලිම් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවශ්‍ය සහය ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරයි.

- මුස්ලිම් පාසල් 94 ක විදුහල්පතිවරුන් සඳහා ධාරිතා වර්ධන හා ව්‍යවසායකත්ව පුහුණු වැඩමුළු පවත්වන ලදී.
- මුස්ලිම් පාසල් පුස්තකාල සඳහා අතිරේක කියවීම් ද්‍රව්‍ය සපයා දෙන ලදී.
- උතුරු පළාතේ මුස්ලිම් ගුරුවරුන් පුහුණු කිරීම ක්‍රමවත් කිරීම සඳහා කෝපායි ගුරු විද්‍යාලයයේ ශාඛාවක් පිහිටුවීමට පියවර ගනු ලැබිණි.
- උතුරු, නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීමේ දී එම පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවීමට සැලසුම් කරන ලදී.
- පාසල් දහස ව්‍යාපෘතියට අයත් මුස්ලිම් පාසල්වල අරාබි භාෂාව ව්‍යාප්ත කිරීමට පියවර ගන්නා ලදී.
- මුස්ලිම් පාසල්වලට ඉස්ලාමීය බැංකු හා මූල්‍ය කටයුතු හඳුන්වා දීම ඇරඹිණි.
- අඩු සාධන මට්ටමක් සහිත මුස්ලිම් පාසල්වලට ස්වයං ඉගෙනුම් කට්ටල සපයා දෙන ලදී.

## 8.21 දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනය

දැනුම පදනම් කරගත් ආර්ථික හා සමාජයීය සංවර්ධනයක් උදෙසා දෙමළ මාධ්‍ය සිසුන්ගේ සහභාගීවත්ය තහවුරු කිරීම පිණිස දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනයට අධ්‍යාපන අමාත්‍යාංශය පියවරගෙන ඇත.

- දෙමළ මාධ්‍ය පාසල්වලට බලපාන ප්‍රධානත ම ගැටළු 8ක් හඳුනාගෙන වියදම් යැවීම සඳහා සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා කරන ලදී.
- පාසල් දහස ව්‍යාපෘතියට අයත් දෙමළ මාධ්‍ය පාසල් 175ක් සංවර්ධනයට අවශ්‍ය පියවර ගනු ලැබිණි.
- ගුරුවරුන් හා විදුහල්පතිවරුන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## 8.22 නොවිධිමත් අධ්‍යාපනය

විවිධ හේතූන් නිසා පාසල් හැරයන සිසුන්ට මෙන් ම වැඩිහිටියන්ට ද විකල්ප අධ්‍යාපන පහසුකම් සැපයීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ සාක්ෂරතා වැඩසටහන්, නිපුණතා සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිකාර්ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී

| වැඩසටහන | 2011 ප්‍රගතිය |
|---|---|
| **ප්‍රජා ඉගෙනුම් වැඩසටහන** | මධ්‍යස්ථාන 171 ක් ක්‍රියාත්මක වේ. උපදේශකවරු 50ක් පුහුණු කරන ලදී. |
| **ව්‍යවසායකත්ව අධ්‍යාපනය** | පුහුණුකරුවන් 100ක් පුහුණු කරන ලදී. |
| **කාර්ය බද්ධ ඉගෙනුම් මධ්‍යස්ථාන** | මධ්‍යස්ථාන 66ක ක්‍රියාත්මකයි උපදේශකවරුන් 90 ක් පුහුණු කරන ලදී. |
| **වීදි දරුවන් සඳහා වැඩසටහන්** | දරුවන් 220කට අධ්‍යාපන අවස්ථා සපයන ලදී. |
| **නොවිධිමත් උපදේශකවරුන්ගේ ධාරිතා වර්ධනය** | උපදේශකවරුන් 50ක් පුහුණු කරන ලදී. |
| **සාක්ෂරතා වැඩසටහන** | සිංහල, දෙමළ හා ගණිතය සඳහා ගුරු උපදෙස් සංග්‍රහයක් පිළියෙල කරන ලදී. උපදේශකවරු 90 ක් පුහුණු කරන ලදී. |

## 8.23 විශේෂ අධ්‍යාපනය

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් අධ්‍යාපනය වෙනුවෙන් අන්තර්කරණ අධ්‍යාපනය දිරිගැන්වීමට පියවර ගනු ලැබේ. ඒ සමග ම සාමාන්‍ය පාසලට ඇතුළත් විය නොහැකි දරුවන් සඳහා සුවිශේෂී පහසුකම් සහිත අධ්‍යාපන අවස්ථා සැපයීමට අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගනී.

- විශේෂ අවශ්‍යතා සහිත ගුරුවරුන්ගේ අධ්‍යාපන සංවර්ධනය සඳහා ජාතික හා පළාත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට කටයුතු කෙරේ.
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ පෞරුෂ වර්ධනය සඳහා ශිෂ්‍ය කඳවුරු 25 ක් පවත්වන ලදී.
- ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ඌනතා සහිත දරුවන්ට සවන් වහල් සහ ඇස් කණ්ණාඩි සැපයීම මගින් ඔවුන්ගේ අධ්‍යාපන සහභාගීත්වය වැඩි කිරීමට පියවර ගනු ලැබිණි
- ආබාධිත දරුවන්ට ප්‍රවේශ පහසුකම් වැඩි කරනු පිණිස ගොඩනැගිලි නවීකරණ කිරීම් කටයුතු සිදු කරන ලදී.
- බ්‍රේල් පෙළපොත් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා බ්‍රේල් මුද්‍රණාලයයට අවශ්‍ය උපකරණ සපයන ලදී.




තොරතුරු තාක්ෂණ ගුරු හා සිසු කුසලතා ඇගයීමේ තරගාවලියක
ජයග්‍රහකයින්ට සම්මාන ප්‍රදානය




උතුරේ දරුවන්ගේ කුසලතා අගයමින්




පාසල් වෛද්‍ය පරීක්ෂණ තුළින් දරුවන්ගේ සෞඛ්‍ය ගැටලු
හඳුනාගැනීමට ක්‍රියාකෙරේ

# පරිච්ඡේදය 9 :
# අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සහ ගුණාත්මක බව තහවුරු කිරීම

## 9.1 පාසල් ඇගයීම සහ අධීක්ෂණය

අධ්‍යාපන අමාත්‍යාංශය පළාත් අධ්‍යාපන බලධාරීන් සමඟ එක් ව අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය තහවුරු කර ගැනීම සඳහා පාසල් ඇගයීම් සහ අධීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. පාසල් ස්වයං ඇගයීම් සහ බාහිර ඇගයීම් යනුවෙන් ප්‍රධාන සංරචක 2 ක් ඔස්සේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කර, පාසල් ගුණාත්මක දර්ශකය හැම පාසලක් සඳහා ම පිළියෙල කිරීමට පියවර ගනු ලැබේ.

| වැඩසටහන | 2011 ප්‍රගතිය |
|---|---|
| **විදුහල්පතිවරුන් හා කලාප අධ්‍යක්ෂවරුන් පාසල් ස්වයං ඇගයීම පිළිබඳ දැනුවත් කිරීම.** | නිට්ටඹුව - 156 ඉබ්බාගමුව - 125<br>නිවිතිගල - 139 තෙල්දෙනිය - 57 දෙනෙකු පුහුණු කරන ලදී. |
| **පාසල් බාහිර ඇගයීම පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීම** | බස්නාහිර, ඌව, සබරගමුව , මධ්‍යම හා වයඹ පළාත්වලින් අධීක්ෂකවරුන් 55 දෙනෙකු පුහුණු කරන ලදී. |
| **අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජාතික පාසල් අධීක්ෂණය** | එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරණායක විද්‍යාලය, වේයන්ගොඩ.<br>අල් මදීනා ජාතික පාසල, සියඹලා ගස් කොටුව<br>රජවැල්ල හින්දු ජාතික පාසල,<br>අලුත්ගම මධ්‍ය මහා විද්‍යාලයය,<br>අජේ.ආර්. ජයවර්ධන ම.ම.වි., පඩුවස් නුවර<br>සේනානායක ම.ම.වි.මාදම්පේ<br>සුජාතා විද්‍යාලය, මාතර |

## 9.2 අධ්‍යාපන පර්යේෂණ

කොළඹ විශ්ව විද්‍යාල ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථාන මගින් ප්‍රාථමික හා ද්විතීයික අවධිවල ප්‍රධාන විෂයයන් කීපයක් සඳහා නිශ්චිත කාලයකට වරක් "ඉගෙනුම් ඵල පිළිබඳ ජාතික ඇගයීම" සිදු කරනු ලබේ.
මෙම ඇගයීමේ ප්‍රතිඵල පුළුල් ව බෙදාහැරීම හා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා භාවිතා කිරීමට කටයුතු කර ඇත. ඒ සමග ම සියලු විෂය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කිරීමට හා එම තොරතුරු භාවිතය දිරිමත් කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

## 9.3. අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (EMIS)

අධ්‍යාපනයේ ගුණාත්මක බව හා තහවුරු කෙරෙන ප්‍රතිපත්ති ගැනීම සඳහා දත්ත හා තොරතුරු භාවිතා කිරීමේ ප්‍රමාණය ඉහළ නැංවීමට පියවර ගනු ලැබේ. වාර්ෂික පාසල් සංගණනය මගින් ලැබෙන තොරතුරු මත විස්තරාත්මක අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් අමාත්‍යාංශයේ ස්ථාපනය කර ඇත.

- 2011 වර්ෂයේදී සියලු ම රජයේ පාසල්වල භෞතික සම්පත් සමීක්ෂණය සිදුකර පරිගණක ගත කරන ලදී.
- සියලු ම ගුරුවරුන්ගේ තොරතුරු පරිගණක ගත කරන ලදී.
- 2011 දී උතුරු පළාතේ පාසල් සිතියම්කරණය නිමකිරීමත් සමඟ දිවයිනේ සියලු ම පාසල් සිතියම් ගත කොට භූගෝලීය තොරතුරු පද්ධතියට (GIS) ඇතුළත් කර ඇත.